

# උපෝෂිත සීලවිභාවිනිය

සරණාගමන ප්‍රභේදසහිත

# උපොෂථ ශීලවිභාවිනීය

කායගතාසති බුද්ධානුස්මෘති ආදි

භාවනා සහිතයි.

එසේම

පදාර්ථ භාවාර්ථ සන්න සහිත

## චක්‍ර සූත්‍රය

සහ

ජාත්‍යදි නිර්වචන.

රත්මලානේ පරමධම්මචේතියාරාම වාසී

සරණතිස්ස ස්වාමීන් විසින්

සංග්‍රහ කරණ ලදින්

ඇම්. අන්ද්‍රිස්අප්පුහාමි විසින්

ශාස්ත්‍රාලෝක අච්චුකන්තෝරුවෙ

අච්චුගස්වන ලදී.

ශ්‍රී. බු. 2431.

# දැන්වීමයි.

බුද්ධභක්තික මහත්වරුනි,

සර්වලෝක ශිවඞ්කරවූ අප ලොව්තුරා බුදුරජානන්වහන්සේවිසින් ලෝකසත්වයන් කෙරෙහි පතල මහත් කරුණාවෙන් සියලුසතුන් සසරකතරින් ගොඩනගා අමාමහ නිවන්සැප සිද්ධකරදීමට දෙසනා කරවදාලේ දානශීලභාවනා යන ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවස්තු සඞ්ඛ්‍යාත උත්තම ක්‍රමයයි—එහෙයින් ශ්‍රද්ධාවන්ත සියලු උපාසක උපාසිකාදීන් විසින් සරණගතව පඤ්චසීල අෂ්ටාඞ්ගශීලාදීන්හි පිහිටා දානසීලීව බුද්ධානුස්මෘති කායගතාසති ආදී ඒ ඒ භාවනාමාර්ගයන් භාවනාකරමින් උපනිශ්‍රය පිරීමෙන් පරම ශාන්ත නිවන්සැප ලබාගත හැකිවේ- එහෙයින් රත්මලානේ පදිංචි පණාගොඩ ලියනගේ දොන් ජ්‍රෝනිමුස් සෙනෙවිරත්න විදානආරච්චි මහත්මයානන් විසින් ආරාධනා කරණලදින් රත්මලානේ පරමධම්මචෙතියාරාමවාසී සරණතිස්ස සාමින් විසින් සඞ්ග්‍රහ කරණලදුව නොයෙක් කරුණු සලකා ඒ ඒ ඕනෑකරණ ක්‍රම පින්වත් උපාසක උපාසිකාදීන්ට පහසුවෙන් දැනගතහැකිලෙස මේ පොත මෙසේ මුද්‍රණය කරවූයෙමි—එනම්, පළමුකොට ශීල විභාග සඞ්ඛ්‍යාත සරණාගමනය ප්‍රභේදහා උපෝෂථශීලප්‍රභේදද ඊටමම එකතු අවශේෂ ශීලාදියද සරණශීල උපෝෂථශීලාදිය සමාදන්වන ආකාරප්‍රභේදද සමාදන්වූවන්විසින් පැවතිය යුතුක්‍රමද එකල්හි භාවනාකටයුතු භාවනා මාර්ගද යන ඒ ඒ භාවනාවන් හා ඒ ඒ අදහස්ද යනාදිය මෙහි පැහැදිලිව ප්‍රකාශවේ—ඉක්බිති ඊටම යෙදෙන බුදුන් වදාළ චක්‍රසූත්‍රදෙශනාව පදාර්ථ භාවාර්ථ සන්න සහිතවද ජාතිජරාදීන්ගේ ප්‍රභේදද එසේම සංක්ෂෙපයෙන් චතුරාර්‍ය්‍යසත්‍යයද රාගද්වෙෂමොහාදීන්ගේ ප්‍රභේදද එසේම මෙකී ජාතිජරාදීන්හා රාගද්වෙෂාදීන් ප්‍රහාණ කරණ පරිදිද දානශීලීස්වභාවද යනාදිනොයෙක් ගැඹුරු ධර්මකොට්ඨාසයන් මෙහි අන්තර්ගතවේ—ඉතින් යටකී ක්‍රමයෙන් දානශීලභාවනා යන ත්‍රිවිධාකාරම මෙහි ප්‍රකාශවන හෙයින් සියලුම බුද්ධාගම්කාර සමූහයාවිසින් මෙය රැගෙණ ඉගෙණ නියමවූ ක්‍රමයෙන් පින්රැස්කරගෙණ කෙළවර අමෘතමහානිර්වාණසැප ලැබීමට උත්සාහකටයුතුයි.

ඇම්. අන්ද්‍රිස් අප්පුහාමි.

# උපෝසථ ශීල විභාවිනිය.

—oo—

**න මෝ බු ද්ධා ය.**

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං

සපඤ්ඤො, සප්‍රාඥවූ; නරො, යම්සත්ව පුද්ගලයෙක්තෙම; සීලෙපතිට්ඨාය, සීලපරිපූරණයෙන් සීලයෙහි පිහිටා; චිත්තං පඤ්ඤඤ්ච, සමාධියහා විදර්ශනාව; භාවයං, වඩමින්; ආතාපී, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ; නිපකො. ප්‍රඥාවෙන් සමන්විතව දක්ෂවූ; සොභික්ඛු සීලාදීන් සමන්විතවූ ඒ සමණ තෙම; ජටං, ආත්මසන්තාන පතිත තෘෂ්ණානැමති අවුල; විජටයෙ, සංසන්දනය කරමින් අවුල් හරින්නේය-භාවය, ප්‍රඥාස හිතවූ යම්මනුෂ්‍යයෙක්තෙම ශීලයෙහි පිහිටා සමාධියහා විද ර්ශනාවඩමින් කෙලෙස්තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ ඒ පැණවත් මහණතෙම එකසියඅටකැයි ප්‍රභෙදවූ දුක්ඛසමුදයවූ තෘෂ්ණා නමැති අවුලහරින්නේයයි වදාලසේක.

අයං පතිට්ඨා ධරණීව පාණිනං
ඉදඤ්ච මූලං කුසලාභිවුද්ධියා
මුඛඤ්චිදං සබ්බ ජිනානුසාසනෙ
යො සීලක්ඛන්ධො වරපාතිමොක්ඛියො.

වරපාතිමොක්ඛියො, උත්තම ප්‍රාතිමොක්ෂයද ඇත්තාවූ; යොසීලක්ඛන්ධො, යම්ශීලස්කන්ධයක්වේද; අයං, ඒ මේ ශීලස්කන්ධය; පාණිනං, ප්‍රාණීන්ට; ධරණීඉව පෘථිවියමෙන්; පතිට්ඨා, (නිවන්පතන උත්තමයන්ට) ප්‍රතිෂ්ඨාධාරය; කුසලාභිවුද්ධියා සර්වකුශලාභිවෘද්ධියට; ඉදංචමූලං, මේසීලයම මූල්ය; සබ්බජිනානුසාසනෙ, සියලු සර්වඥවරයන්ගේ අනුසාසනායෙහි; ඉදංච, මේසීලයම; මුඛං, ප්‍රධානයයි-භාවය උත්තම්ප්‍රාතිමොක්ෂයඇති යම් ශීලස්කන්ධයක්වේද ඒ මේ ශීලස්කන්ධය සත්වයන්ට මහපොළොවමෙන් නිවන්පතන උත්තමයන්ට පිහිටය; සියලුකුසල් දියුණුවට මේ සීලයම මූල්ය; සකල සර්වඥවරයන්ගේ අනුශාසනායෙහි මේ සීලයම ප්‍රධානයයි වදාලසේක; මෙසේසියලු කුසලාභි වෘද්ධියට සීලයම ප්‍රධානහෙයින් සියලුඋපාසකාදීන් විසින් සීලයෙහි පිහිටන ක්‍රම ඉංගණ සීලසංරක්ෂණය කටයුතුවනිසා අටසිල්සමාදන්වෙන ක්‍රමය සංක්ෂෙපයෙන් කියනුලැබේ.

විධිනොවරදවා පිළිපදින්නාන්විසින් "නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස" මෙසේ තෙවරක්කියා වැද.

බුද්ධංසරණං ගච්ඡාමි, ධම්මංසරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි, දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි, තිදුයම්පි ධම්මං

සරණං ගච්ඡාමි, දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි, තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි, තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි, තතියම්පි සංඝං සරණං ගච්ඡාමි, මෙසේ සරණ පිහිටා "අහං භන්තෙ අජ්ජිමඤ්ච දිවසං උපොසථං උපවසාමි අට්ඨඞ්ග සමන්නාගතං සීලං සමාදියාමි" යනුද—"අහං භන්තෙ අජ්ජිමඤ්ච රත්තිං උපොසථං උපවසාමි අට්ඨඞ්ගසමන්නාගතං සීලං සමාදියාමි"යි මෙසේ දිවාරාත්‍රී වශයෙන් කාලභේදකොට—"පාණාතිපාතා වෙරමණීසික්ඛා පදංසමාදියාමි, අදින්නාදානා වෙරමණීසික්ඛා පදංසමාදියාමි, අබ්‍රහ්මචරියා වෙරමණීසික්ඛා පදංසමාදියාමි, මුසාවාදා වෙරමණීසික්ඛා පදංසමාදියාමි, සුරාමේරය මජ්ජ පමාදට්ඨානා වෙරමණීසික්ඛා පදංසමාදියාමි, විකාලභෝජනා වෙරමණීසික්ඛා පදංසමාදියාමි, නච්ච ගීත වාදිත විසූක දස්සන මාලාගන්ධවිලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණීසික්ඛා පදංසමාදියාමි, උච්චාසයන මහාසයනා වෙරණීසික්ඛා පදංසමාදියාමි" මෙසේ චෛත්‍යස්ථානයකට එළඹ ශ්‍රමණයන් වහන්සේනමකට ආරාධනාකර සිල්සමාදන්වියුතු එසේ නොලැබුනොත් අසවල් දිසාවේ චෛත්‍ය ස්ථානයක් ඇතැයි විවෙක ස්ථානයකට පැමින ඒදිසාභාගයට වැද නමස්කාරපාඨය තුන්වරක්කියා "අහම්පජ්ජිමංච දිවසං, අහම්පජ්ජිමංචරත්තිං" මේආදී ක්‍රමයෙන් දිවාරාත්‍රී වශයෙන් කාලපරිච්ඡේදකොට හෝ තෙමේම සිල්සමාදන් වියයුතුයි—සරණයායුතු විධි සතරයි, එනම් නිවන්පිණිස තුනුරුවන් සරණම්ස අන්සරණක් නැතැයි සැදැහැසිතින් " අජ්ජාදිංකත්වා අහංඅත්තානං බුද්ධස්ස නියාතෙමි අජ්ජාදිංකත්වා අහං අත්තානං ධම්මස්ස නියාතෙමි අජ්ජාදිංකත්වා අහං අත්තානං සඞ්ඝස්ස නියාතෙමි" යි අදපටන් මම ආත්මය බුදුන්ටපුදමි ධර්මයටපුදමි සංඝයාටපුදමි යි රත්නත්‍රයට ආත්මය පිදීමෙන් පිහිටන ආත්මසංනියාතන සරණ ගමනයය, "අජ්ජාදිංකත්වා අහංබුද්ධපරායනො අජ්ජාදිංකත්වා අහංධම්මපරායනො අජ්ජාදිංකත්වා අහංසංඝපරායනො" යි අදපටන්මම බුද්ධ පරායනයෙමි ධර්ම පරායනයෙමි සංඝ පරායනයෙමි යි රත්නත්‍රයම පිහිටකොට සිතායන තත්පරායන සරණගමන්යය, "අජ්ජාදිංකත්වා අහංබුද්ධස්ස අන්තෙවාසිකො අජ්ජාදිංකත්වා අහංධම්මස්ස අන්තෙවාසිකො අජ්ජාදිංකත්වා අහංසංඝස්ස අන්තෙවාසිකො"යි අදපටන් මම බුදුන්ගේ අතවැස්සෙමි ධර්මයාගේ අතවැසිවෙමි සංඝයාගේ අතවැසිවෙමි යි තුනුරුවන්ට අතවැසිභාවයෙන් එළඹෙන ශිෂ්‍යභාවූපගමන සරණගමනයය, "අජ්ජාදිංකත්වා අහං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං බුද්ධාදීනං යෙව තිණ්ණං වත්ථූනං කරොමි"යි අදපටන්

මම බුද්ධාදි රත්නත්‍රයට දුකින් මිදීමසඳහා ප්‍රත්‍යුපස්ථාන අජලි
කම් සාමීචිකම් කරමි වඳිමියි සරණයාම ප්‍රණිපාතනනම්-මෙ
කී සතරආකාරයෙන් හෝ එකාකාරකින් හෝ තුණුරුවන්
සරණයායුතු-මිථ්‍යාදෘෂ්ටි වශයෙන්සිතා ඒ භෙදනොකොට
යෙහෙත් ආරක්ෂාකළයුතුයි මෙසේ තිසරණ පිහිටියන්විසින්
මිනිසුන් වෙලඳූමය පරහිංසාපිණිස සාදනලද දුනු තුවක්කු
ඈතලආදි වෙළඳූමය මත්වීමෙන් ප්‍රමාදයට හෙතුවූ රහමෙර
වෙලඳූමය මුවන් ඌරන් යනාදීන් ඇතිකොට මාංසපිණිස
විකිණීමය සතුන්මැරීමපිණිස යොදලද විෂජාති වෙළඳූමය
යනවෙලඳූම් පස දිවිහිමියෙන් නොකටයුතු, සීලයෙහි අඟ
අටනම් සමාදන්වූ සීලය කෙළවරකින් තුබූන්හෙයින් අඛ
ණ්ඩය සමාදයිශික්ෂාපදයක් තුබුන්හෙයින් අච්ඡිද්‍රය පිළිවෙළින්
ශික්ෂාපද කීපයක් තුබුන්හෙයින් අසබලය එකක්හැර එකක්
තුබුන්හෙයින් අකම්මාසය ත මා තණ්හා දෘශාදාසවයෙන්මුදා
නිවන්අක්වනහෙයින් භුජිස්සය නුවනැත්තන්විසින් ප්‍රශංසා
කටයුතුහෙයින් විඤ්ඤුප්පසත්ථය සසරසම්පත් නොපතනාහෙ
යින් අපරාමට්ඨය සිහිකිරීමෙන් සිත එකඟවනහෙයින් සමාධි
සංවත්තනිකය යනමෙයි-මෙසේ අෂ්ටාංග සමන්විතවූ සීලය
මනාවරැක නිවන්පසක් කළයුතුය යථෝක්ත අෂ්ටාංග සමන්
විතවූ සීලය සමාදන්ව රක්ෂාකරන්නවුන්ගේ සිත ලොභාදී
යම් කිසි කෙලශයෙක් නිසා කිළුටුකරන්නේ වේනම් එයින්
තමන්ගේ සීලය අපිරිසිදුවේයයි නුවනින් සලකා එක්ණෙහිම
ඒ පිරිසිදුවීමට “ඉතිපිසො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජා
චරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම
සාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති” මෙසේ බුදුගුණ
මෙනෙහිකර බුද්ධානුස්සෘති භාවනාව වැඩියයුතු, මෙසේ බුදු
ගුණ මෙනෙහිකර පිරිසිදුව රකිනා සීලය ආර්ය උපොසථය
නම්වේ එසේම සිත අපිරිසිදුවූකල්හි “ස්වාක්ඛාතො භගවතා
ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො
පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති” මෙසේ ධම්මානුස්සෘති භාව
නාව සිත්හිලා වැඩියයුතු, මෙසේ දම්ගුණවඩමින් පිරිසිදුව
රකිනා සීලය ධම්ම උපොසථයනම්වේ එසේම සිත අපිරිසිදුවූකා
ල්හි “සුපටිපන්නො භගවතො සාවකසංඝො උජුපටිපන්නො
භගවතො සාවකසංඝො ඤායපටිපන්නො භගවතො සාවක
සංඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො යදිදං
චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එසභගවතො සාව
කසංඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අංජලි
කරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති” මෙසේ
සංඝානුස්සෘති භාවනාව වැඩියයුතු, මෙසේ සංඝයාගේ ගුණ

මෙමනෙයිකාර පිරිසිදුව රකිනාසීලය සංඝ උපොසථයනම්වේ- පටිජාගරණ උපොසථය "තංකරොන්තා එකස්මිං අඩ්ඪමාසෙ චතුන්නං උපොසථ දිවසානං පච්චුග්ගමනානුග්ගමන වසෙන කරොන්ති" යි ඒ කරන්නෝ එක අඩමසක්තුලවූ පොහෝදින සතරකට පෙරගමන් පසුගමන්වශයෙන් කෙරෙත් කෙසේද "පඤ්චමීඋපොසථං පච්චුග්ගච්ඡන්තා චතුත්ථියං උපොසථිකා හොන්ති අනුගච්ඡන්තා ඡට්ඨියං" යනාදී ක්‍රමයෙන් පඤ්චමීඋපොසථයට පෙර ගමන්වශයෙන් ජලවක දැද පසුගමන්වශයෙන් නවවක දැද තුදුස්වක්පොයොයට පෙරගමන්වශයෙන් තෙළෙස්වකදැද පසළොස්වක පොහොයට පෙරගමන්වශයෙන් තුදුස්වකදැද පසුගමන්වශයෙන් පෑලවියදැදැයි මෙකීදිනයන්හි අටසිල්සමාදන්ව රැකීම පටිජාගරණ උපොසථයනම්වේ.

"පංචමී අට්ඨමී චාතුද්දසී පණ්ණරසිති පුණ්ණහපක්ඛෙ චත්තාරො තථාකාලපක්ඛෙති මාසස්ස අට්ඨදිවසා පකතිඋපොසථස්ස කාලො" යි විසේනිය අටවක තුදුස්වක පසළොස්වකයයි පූරපක්ෂයෙහි සතරක, කාලපක්ෂයෙහිද එසේම සතරකැයි මසකට අටදිනක් ප්‍රකෘති උපොසථයට කාලයවේ "චතුත්ථී ඡට්ඨී සත්තමී නවමී තෙරසීති පුණ්ණෙහ පක්ඛෙ පාටිපද චතුත්ථී ඡට්ඨී සත්තමී නවමී තෙරසීවා කාලෙ ඡාතිමාසස්ස එකාදසදිවසා පටිජාගරණ උපොසථස්ස කාලොයි" ජලවක සැටවක සතවක නවක තෙලෙස්වකයයි පූරපක්ෂයෙහි පසෙක, පෑලවිය ජලවක සැටවක සතවක නවවක තෙලෙස්වකයයි කෘෂ්ණපක්ෂයෙහි සයෙකැයි මසකට එකොළොස් දිනක් පටිජාගරණ උපොසථයාගේ කාලයවේ මෙසේදැන පටිජාගරණ උපෙසථයද රැකියයුතු.

ප්‍රාතිහාර්යපක්ෂ උපොසථය "වස්සූපනායිකාය පුරිමභාගෙ ආසාළ්හමාසො අන්තො වස්සෙ තයො මාසා කත්තිකමාසොති ඉමෙ පඤ්චමාසා පාටිහාරියපක්ඛොති වුච්චන්ති ආසාළ්හ කත්තික ඵග්ගුනමාසා තයො එව වාති" මෙසේ වස්එළඹීමට පූර්වභාගයෙහි ඇසළමසය ඇතුලුවසතෙමසය ඉල්මසයයි මේ පස්මස ප්‍රාතිහාර්ය පක්ෂයයි කියනුලැබේ, ඇසල ඉල් මැදින් තෙමසහෝ ප්‍රාතිහාර්ය පක්ෂනම්, මෙකීමාස පක්ෂයන්හි අෂ්ටාංග සමන්විතවූ සීලයසමාදන්ව රැකීම ප්‍රාතිහාර්ය පක්ෂ උපොසථයවේ සමාදන්වෙන ක්‍රමය මෙසේ දතයුතු භික්ෂූන් පෙර වස්එලඹෙනදින අටසිල්සමාදන්වී පෙරවස්පවාරණය කරණදිනදක්වා තුන්මස සම්පූර්ණයෙන් පිරිසිදුව සිල්රැකපවාරණය කරණදින සිල්මිදියයුතු, තවද පෙරවස් පවාරණයකරණදින සිල්සමාදන්වී මනාවරැක ඉල්මස පසළොස්වකදා සිල්

විඳියුතු, තුන්ඍතුයෙහිම කෙලවරවූ ඇසල ඉල් මැඳින්යන තුන්මස සිල්සමාදන්ව රැකියයුතු, එකිඑකි ඍතුන්ගේ කෙලවර පසළොස්දිනක් පාසා සිල්සමාදන්ව රැකියයුතු මේ ක්‍රමයෙන් සිල්සමාදන්ව රැකීම ප්‍රාතිහාර්ය පක්ෂ උපෝසථයනම්. (පන්සිල්රැකීමනම් මුලකී ක්‍රමයෙන් සරණපිහිටා පාණාතිපාතා වෙරමනීසික්ඛා පදංසමාදියාමි, අදින්නාදානා වෙරමනීසික්ඛා පදංසමාදියාමි, කාමෙසුමිච්ඡාචාරා වෙරමනීසික්ඛා පදංසමාදියාමි, මුසාවාදා වෙරමනීසික්ඛා පදංසමාදියාමි, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමනීසික්ඛා පදංසමාදියාමි”යි සමාදන්ව සතුන්මැරීමය අයිනාදනය කාමමිත්‍ථ්‍යාචාරය බොරුකීමය සුරාපානය යනමේ පස්පවින් වැළකීමයි.)

මෙසේ සිල්පිහිටියත්විසින් කායානුපස්සනා භාවනාව භාවිතා කටයුතු “අත්ථිඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිංඝා නිකා ලසිකා මුත්තං මත්ථකෙ මත්ථලුංගන්ති.” මෙසේ පාඩම්කර මතුප්‍රකාශවන ක්‍රමයට අත්ථි මෙනෙහි කරණු, ඉමස්මිංකායෙ, මේශරීරයෙහි, කෙසා, හිස්කබලපිට පිහිටියාවූ අඩුතුන්කෙළක් කෙසයෝ, අත්ථි, ඇත්තාහුය, ලොමා, අතුල් පතුල්හැර සෙසු සියලු කයෙහි හටගත්තාවූ නවානුදහසක් ලොමයෝද, නඛා, ඇඟිලිඅගපිහිටියාවූ කුනුමස් පිළිපොතුවැනි සටහන්ඇති විසිනියපොතුද, දන්තා, මැටිසකෙක හිඳුවූ ලබුබිජුපෙලක්මෙන් දෙතිකටෙහි හටගත් දෙතිසක්පමණ දත්ඇටද, තචො, වැටකොලු එලෙක පිටපොත්තක්මෙන් මේ දුර්මාංශය වසාතිබෙන සමෙක්ද, මංසං, ඇට නහර වැළඳසිටියාවූ නවසියයක් මස්පිඩුද, නහාරු, දඹුබිතෙක්හි වැද්දගෙණසිටි වැල්මෙන් තුන්සියයක් ඇටසඟල් වැළඳගෙණසිටි නවසියයක් නහරවැල්ද, අට්ඨි, එකසියඅසූවක් සන්ධියෙන් ගැවසීගත්තාවූ තුන්සියයක් ඇටසඟල්ද, අට්ඨිමිඤ්ජා, හුනකුඹලෙක බහාලූ ඉඳුනු වේබඩක්මෙන් ඇටඇතුලෙහි පිහිටි ඇටමිදුළුද, වක්කං, ගළඋල්ලුයෙන් නික්ම එකනාවූගේ පලගත් විලිකුත් අඹපලදෙකක්මෙන් දෙතන මැද පුරාසිටිනා වකුගඩු මාංශයද; හදයං, පිටපත්හළ රත් නෙළුම් කැකුලක්බඳු අඩකුලුඳුලක් ලෙහෙයෙන් පිරුණු සත්නාබ්‍යන්තරයෙහි පිහිටි හෘදමාංශයෙක්ද; යකනං, දෙනැලයනිසා සතනාබ්‍යන්තරයෙහි පිහිටි රතඹුලු මලෙක්ජ පිටිපත පැනැවැනි කොබොලීල පතසෙ මුල්න් එකක්ද අගින් දෙමස්පටලයක්ව බෙදීතිබෙන අක්මා මාංශයද; කිලොමකං, ගෙළදුහුලක්මෙන් දළඹුවෙක්ද; පිහකං, හෘදය

මාංශයාගේ වාමභාගයෙහි පිහිටි සතඟුලක්පමණ දිගඇති මලාගිය නිකමලෙක පැහැවැති බඩදිවෙද; පප්ඵාසං, සැතිව එලෙන්නාවූ පිළිකුල්කරණ පපුවෙක්ද; අන්තං, හිස්වල්පත් ඇලිගැරඬියකුමෙන් එක්විසිතැනකින් නැමීතිබෙන්නාවූ ස්ත්‍රීන්ට අටවිසිරියනක්හා පුරුෂයන්ට දෙතිස්රියන් බඩවැලෙක්ද; අන්තගුණං, එක්විසිතැනකින් නැමීතිබෙන බඩවැල එපිට මෙපිට නොයනලෙස බැන්දාවූ අතුනුබහුනක්ද; උදරියං, පෙරහන්කඩකලු සහල්දියත්තක්මෙන් කෑ අහරසිටිනා උදරයෙක්ද; කරීසං, පෙකනියෙන්පහල අධොභාගීයෙන් උඩ අටඟුලක්පමණ වසටකටුව දක්වා පූරතිබෙන අසූචිද; පිත්තං, බද්ධාබද්ධවශයෙන් ද්විප්‍රකාරවසිටි පිත්කොෂයක්ද; සෙම්හං, උදරපටලයපටන් උගුරදක්වා කැහැලිපොත්තෙන බෙලසූලක්මෙන් ආහාරාදීන් වැලඳසිටිනා ශ්ලෙෂ්මාවද; පුබ්බො, කනුකටු ආදිය ඇනුනතැන්හිද ගඩපොලආදිය නැගුනුතන්හිද කුනු බොර මඩවන් ලේපැසුනු සැරවයද; ලොහිතං, මසින් ඉතිරු සියලුකයගතුලෙහි පවත්නාවූ ලෙහෙද; සෙදො, සූර්‍ය්‍යාග්නි සන්තාපාදිප්‍රත්‍යයක් ඇතිකල්හි කෙසලොමයන්ගේ කූපයන් පිහිටි සථානවලින් වැහෙණ ඩහදියද; මෙදො, කසාරුදු රෙද්දක් දෙතුන්වැටි කළාක්මෙන් සම් මස් දෙකට අතරේ පිහිටි මෙදනම් තෙල්ද; අස්සු, ඇස්සකපා තිබූ තල්කසපැනක් වැනි පැන්පුර ගත්තාක්මෙන් දෙඇස්පුර තිබෙන කඳුළුද; වසා, අතුල් පතුල් කන් නාසාදියෙන් පිටත්වන්නාවූ වසානම් තෙල්ද; ඛෙලො, ආහාරපාන වගීජතියක් දුටුකල්හිද අසනකල්හිද දෙකපොල්බිතින් වැගිරෙන්නාවූ කෙළද; සිංඝාණිකා, විසමාහාර සෙවනාදි කාරණයක් ඇතිකල්හි හිස්මුලින් වැහී දෙනාසාපුටයෙහි පිරීසිටි ලා තල්කසපැන් ලොඳබඳු සොටුද; ලසිකා, යමක් කරණකොටගෙණ මේ සරීරය ඔවුනොවුන් කෙරෙහි ඇටනොගැටී ගමනාදිවශයෙන් පවතීද එබඳුවූ එක්සිය අසූවක් සන්ධිඅතුරෙන් නික්මෙන්නාවූ කිනිහිරි ගභක ලහටුවක්බඳු බෙලසූල්නම් අසූචිද; මුත්තං, යමක් මේ සරීරයෙන් පිටත්නොකලකල්හි ශරීරය කම්පාවේද එබඳුවූ මුත්‍රපුටයාගේ ඇතුලෙහි පිරුණු උනුහළුයෙන් වැගුරුණු දියබඳු මුත්‍රද; මත්ථකෙ මත්ථලුංගංති, හිස්කබල පුරාසිටි හිස් දුඹුරු ලබුඵලයෙකබහා ලනලද ලාදියක්මෙන් හිස්කබල පුරාසිටිනා හිස්මොලද; ඉමස්මිංකායෙ, මේසරීරයෙහි; අපී, ඇනැයි වදාලේය මෙසේ පිළිකුල්භාවනාවද මෛත්‍රීභාවනා දසවිධ අසුභ කම්සථානාදීන් මෙනෙහි කරමින් භාවනා කොට සීලාදී ගුණධර්මයන් දියුණුකර සඟමොක් සැපලැබීමට උත්සාහ කටයුතුයි.

# ච ක්ක සු ත්තං.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

එවමෙම්සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ—තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති භදන්තෙ 'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

තයො භික්ඛවෙ ධම්මා ලොකෙ න සංවිජ්ජෙය්‍යුං න තථාගතො ලොකෙ උප්පජ්ජෙය්‍ය අරහං සම්මාසම්බුද්ධො න තථාගතප්පවෙදිතො ධම්මවිනයො ලොකෙ දිප්පෙය්‍ය—කතමෙ තයො ජාති ච ජරා ච මරණඤ්ච, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා ලොකෙ න සංවිජ්ජෙය්‍යුං න තථාගතො ලොකෙ උප්පජ්ජෙය්‍ය අරහං සම්මාසම්බුද්ධො න තථාගතප්පවෙදිතො ධම්මවිනයො ලොකෙ දිප්පෙය්‍ය—යස්මා ච ඛො භික්ඛවෙ ඉමෙ තයො ධම්මා ලොකෙ සංවිජ්ජන්ති තස්මා තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො තස්මා තථාගතප්පවෙදිතො ධම්මවිනයො ලොකෙ දිප්පති—තයො භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං, කතමෙ තයො, රාගං අප්පහාය දොසං අප්පහාය මොහං අප්පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං, කතමෙ තයො, සක්කායදිට්ඨිං අප්පහාය විචිකිච්ඡං අප්පහාය සීලබ්බතපරාමාසං අප්පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං, කතමෙ තයො, අයොනිසො මනසිකාරං අප්පහාය කුම්මග්ගසෙවනං අප්පහාය චෙතසො ලීනත්තං අප්පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසො ලීනත්තං පහාතුං, කතමෙ

තයො, මුට්ඨස්සච්චං අප්පහාය අසම්පජඤ්ඤං අප්පහාය චෙත
සො වික්ඛෙපං අප්පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ
අප්පහාය අභබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්ම
ග්ගසෙවනං පහාතුං චෙතසො ලීනත්තං පහාතුං—තයො
භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො මුට්ඨස්සච්චං පහාතුං
අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං, කත
මෙ තයො, අරියානමදස්සනකම්‍යතං අප්පහාය අරියධම්මස්ස
අසොතුකම්‍යතං අප්පහාය උපාරම්භචිත්තතං අප්පහාය,
ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො මුට්ඨ
ස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං
පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ අප්පහාය අභබ්බො අරියා
නමදස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං
පහාතුං උපාරම්භචිත්තතං පහාතුං, කතමෙ තයො, උද්ධච්චං
අප්පහාය අසංවරං අප්පහාය දුස්සීල්‍යං අප්පහාය, ඉමෙ ඛො
භික්ඛවෙ තයො ධම්මෙ අප්පහාය අභබ්බො අරියානමදස්ස
නකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං
උපාරම්භ චිත්තතං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ අප්ප
හාය අභබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං
පහාතුං, කතමෙ තයො, අස්සද්ධියං අප්පහාය අවදඤ්ඤුතං
අප්පහාය කොසජ්ජං අප්පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො
ධම්මෙ අප්පහාය අභබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහා
තුං දුස්සීල්‍යං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ අප්පහාය
අභබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං
පහාතුං, කතමෙ තයො, අනාදරියං අප්පහාය දොවචස්සතං
අප්පහාය පාපමිත්තතං අප්පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො
ධම්මෙ අප්පහාය අභබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං
පහාතුං කොසජ්ජං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ අප්ප
හාය අභබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාප
මිත්තතං පහාතුං, කතමෙ තයො, අහිරිකං අප්පහාය අනො
ත්තප්පං අප්පහාය පමාදං අප්පහාය, ඉමෙ ඛො භික්ඛවෙ
තයො ධම්මෙ අප්පහාය අභබ්බො අනාදරියං පහාතුං දොවච
ස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං—අහිරිකොයං භික්ඛවෙ
අනොත්තප්පී පමත්තො හොති සො පමත්තො සමානො
අභබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාප
මිත්තතං පහාතුං, සො පාපමිත්තො සමානො අභබ්බො
අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහා
තුං, සො කුසීතො සමානො අභබ්බො උද්ධච්චං පහාතුං
අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං, සො දුස්සීලො සමානො

අභබ්බො අරියානම දස්සන කම්‍යතං පහාතුං අරිය ධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං, සො උපාරම්භචිත්තො සමානො අභබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං, සො වික්ඛිත්තචිත්තො සමානො අභබ්බො අයොනිසො මනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසො ලීනත්තං පහාතුං, සො ලීනචිත්තො සමානො අභබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං, සො විචිකිච්ඡො සමානො අභබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං, සො රාගං අප්පහාය දොසං අප්පහාය මොහං අප්පහාය අභබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං, කතමෙ තයො, රාගං පහාය දොසං පහාය මොහං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං, කතමෙ තයො, සක්කායදිට්ඨිං පහාය විචිකිච්ඡං පහාය සීලබ්බතපරාමාසං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං, කතමෙ තයො, අයොනිසොමනසිකාරං පහාය කුම්මග්ගසෙවනං පහාය චෙතසො ලීනත්තං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසොලීනත්තං පහාතුං, කතමෙ තයො, මුට්ඨස්සච්චං පහාය අසම්පජඤ්ඤං පහාය චෙතසො වික්ඛෙපං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසොලීනත්තං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසොවික්ඛෙපං පහාතුං, කතමෙ තයො, අරියානම්දස්සනකම්‍යතං පහාය අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාය උපාරම්භචිත්තතං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසොවික්ඛෙපං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ

පහාය භබ්බො අරියානම්දස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං, කතමෙ තයො, උද්ධච්චං පහාය අසංවරං පහාය දුස්සීල්‍යං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො අරියානම්දස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං, කතමෙ තයො, අස්සද්ධියං පහාය අවදඤ්ඤුතං පහාය කොසජ්ජං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං, කතමෙ තයො, අනාදරියං පහාය දොවචස්සතං පහාය පාපමිත්තතං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං—තයො භික්ඛවෙ ධම්මෙ පහාය භබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං, කතමෙ තයො, අහිරිකං පහාය අනොත්තප්පං පහාය පමාදං පහාය, ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මෙ පහාය භබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං—හිරිමායං භික්ඛවෙ ඔත්තප්පී අප්පමත්තො හොති, සො අප්පමත්තො සමානො භබ්බො අනාදරියං පහාතුං දොවචස්සතං පහාතුං පාපමිත්තතං පහාතුං, සො කල්‍යාණමිත්තො සමානො භබ්බො අස්සද්ධියං පහාතුං අවදඤ්ඤුතං පහාතුං කොසජ්ජං පහාතුං, සො ආරද්ධවිරියො සමානො භබ්බො උද්ධච්චං පහාතුං අසංවරං පහාතුං දුස්සීල්‍යං පහාතුං, සො සීලවා සමානො භබ්බො අරියානම්දස්සනකම්‍යතං පහාතුං අරියධම්මස්ස අසොතුකම්‍යතං පහාතුං උපාරම්භචිත්තතං පහාතුං, සො අනුපාරම්භචිත්තො සමානො භබ්බො මුට්ඨස්සච්චං පහාතුං අසම්පජඤ්ඤං පහාතුං චෙතසො වික්ඛෙපං පහාතුං, සො අවික්ඛිත්තචිත්තො සමානො භබ්බො අයොනිසොමනසිකාරං පහාතුං කුම්මග්ගසෙවනං පහාතුං චෙතසොලීනත්තං පහාතුං, සො අලීනචිත්තො සමානො භබ්බො සක්කායදිට්ඨිං පහාතුං විචිකිච්ඡං පහාතුං සීලබ්බතපරාමාසං පහාතුං, සො අවිචිකිච්ඡො සමානො භබ්බො රාගං පහාතුං දොසං පහාතුං මොහං පහාතුං, සො රාගං පහාය දොසං පහාය මොහං පහාය භබ්බො ජාතිං පහාතුං ජරං පහාතුං මරණං පහාතුන්ති.

# ච තු සූ ත්‍ර ව ත භා ෂ ය.

——oo——

මෙ, මාවිසින්; එවං, මෙසේ; සුතං, අසනලදී;(නොහොත්) මෙ, මාගේ; සුතං, ඇසීම; එවං, මෙසේය; ඒකංසමයං, (දිව්‍ය බ්‍රහ්මයන්කෙරෙහි ප්‍රකාශ සමයන්අතුරෙන් කරුණාකෘත්‍ය සමය සංඛ්‍යාත)එක් ධර්මදෙශනාසමයෙක්හි; භගවා.භාග්‍යවතුන්වහන්සේ; සාවත්ථියං, ශ්‍රාවස්තීනම්පුරප්‍රවරයෙහිවූ; ජෙතවනෙ, (ජෙතනම් රාජකුමාරයා විසින්; රොපිතසංවර්ධිතහෙයින්) ජෙතවනනම්වූ; අනාථපිණ්ඩිකස්ස, අනේපිඩුමහසිටුහුගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, (ස්ථානගමන නිෂද්‍යාදි ඊර්යාපථ බ්‍රහ්මවිහරණයෙන් යුක්තව) වැඩවාසය කරණසේක; තත්‍රඛො, එසමයෙහිවනාහී; භගවා, භාග්‍යවතුන්වහන්සේ; භික්ඛවොති, මහණෙනිකියා; භික්ඛූ ආමන්තෙසි, භික්ෂූන් කැඳවූසේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහුතුමූ; භදන්ත ඉති ඛො, පින්වතුන් වහන්සැයි කියා; භගවතො, භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචනඇස්සූහ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; එතං, මේ මතු ප්‍රකාශවන ධර්මය; අවොච වදාළසේක, භික්ඛවෙ, මහණෙනි; තයො ධම්මා,ධර්මතුණක්; ලොකෙ, ලෙව්හි; නසංවිජ්ජෙය්‍යුං, විද්‍යමානනොවන්නාහු නම්; අරහං, සියල්ලෙව්වැස්සන්විසින් ප්‍රත්‍යප්‍රතිපත්තිපූජාවසුදුසුවූ; සම්මාසම්බුද්ධො, ගුරුපදෙශවිරහිතව ස්වයම්භූඥානයෙන් චතුස්සත්‍යාවබොධකළාවූ; තථාගතො, (පළමු බුදුවරයන්මෙන් ආවාවූ) තථාගතතෙම; ලොකෙ, ලොකයෙහි; නඋප්පජ්ජෙය්‍ය, පහළනොවන්නේය.

තථාගතප්පවෙදිතො, තථාගතයන්විසින් අවබොධකරණලද; ධම්මවිනයො, ධර්මවිනයතෙම; ලොකෙ, ලොකයෙහි; නදිප්පෙය්‍ය, ප්‍රකාශනොවන්නේය; තයො. (ඒ) ධර්මතුණ; කතමෙ, කවරහුද; ජාතිච, ඉපදීමද; ජරාච (ස්කන්ධයන්ගේ පරණවීමයයි කියනලද) දිරීමද; මරණංච, (ස්කන්ධයන්ගේ බිඳීමයයි කියනලද) මැරීමද යන මොහුයි.

භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො තයො ධම්මා, මේ ධර්මතුණ; ලොකෙ, ලෙව්හි; නසංවිජ්ජෙය්‍යුං, විද්‍යමාන නොවන්නාහුනම්; අරහං, අර්හත්වූ; සම්මා සම්බුද්ධො, සම්‍යක්සම්බුද්ධවූ; තථාගතො, තථාගතතෙම; ලොකෙ, ලොකයෙහි; න උප්පජ්ජෙය්‍ය, පහළ නොවන්නේය.

තථාගතප්පවෙදිතො, තථාගතයන්වහන්සේ විසින් අවබොධ කරණලද; ධම්මවිනයො, ධම්මවිනය, ලොකෙ, ලෙව්හි; නදිප්පෙයය, ප්‍රකාශනොවන්නේය; හෙවත් නොබබලන්නේය.

භික්ඛවෙ, මහණෙනි; යස්මා ච ඛො, යම්හෙයකින්වනාහි; ඉමෙ තයො ධම්මා, මේධර්මතුණ; ලොකෙ, ලෙව්හි; සංවිජ්ජන්ති, විද්‍යමානවෙත්ද; තස්මා, එහෙයින්; අරහං, අර්හත්වූ; සම්මාසම්බුද්ධො, සම්‍යක්සම්බුද්ධවූ; තථාගතො, තථාගතතෙම; ලොකෙ, ලොකයෙහි; උප්පජ්ජති, උපදියි; තස්මා, එහෙයින්; තථාගතප්පවෙදිතො, තථාගතයනවහන්සේ විසින් අවබොධකරණලද; ධම්මවිනයො, ධර්මවිනයතෙම; ලොකෙ, ලොකයෙහි; දිප්පති, බබලයි; භික්ඛවෙ, මහණෙනි; තයො ධම්මෙ, ධර්මතුණක්; අප්පහාය, දුරුනොකොට; ජාතිං පහාතුං, ඉපදීම නැතිකරන්වද; ජරං පහාතුං, ජරාවදුරුකරන්වද; මරණං පහාතුං, මරණයනැතිකරන්වද; අභබ්බො, නොපොහොසත්වේ; තයො, (ඒ) ධර්මතුණ; කතමෙ, කවරහුද, රාගං අප්පහාය, රාගය දුරුනොකොට, දොසං අප්පහාය, වෙෂය දුරු නොකොටා; මොහං අප්පහාය, මොහය දුරුනොකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො තයොධම්මෙ, මේ ධර්මතුණ; අප්පහාය. දුරු නොකොට; ජාතිං පහාතුං, ඉපදීම නැතිකරන්වද; ජරං පහාතුං, ජරාව දුරුකරන්වද; මරණං පහාතුං, මරණය දුරුකරන්වද; අභබ්බො, අභව්‍යවේ; නොහොත් නොපොහොසත්වේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධර්මතුණක්; අප්පහාය, දුරුනොකොට; රාගං පහාතුං, රාගය දුරුකරන්ට; දොසං පහාතුං, වෙෂය දුරුකරන්ට; මොහං පහාතුං, මොහය දුරුකරන්ට; අභබ්බො, නොපොහොසත්වේ; කතමෙ තයො, කවර ධර්මතුණක් දුරු නොකොටදයත්; සක්කායදිට්ඨිං අප්පහාය, සත්කායදෘෂ්ටිය නොහැර; විචිකිච්ඡං අප්පහාය, විචිකිත්සාව නොහැර; සීලබ්බතපරාමාසං අප්පහාය, ශීලව්‍රතපරාමර්ශනය නොහැරත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො තයො ධම්මෙ, මේ ධර්මතුණ; අප්පහාය; දුරු නොකොට; රාගං පහාතුං, රාගය නැතිකරන්ට; දොසං පහාතුං, වෙෂය නැතිකරන්ට; මොහං පහාතුං, මොහය නැතිකරන්ට; අභබ්බො, නොපොහොසත්වේ; භික්ඛවෙ, මහණෙනි; තයො ධම්මෙ, ධර්මතුණක්; අප්පහාය, දුරු නොකොට; සක්කායදිට්ඨිං පහාතුං, සත්කායදෘෂ්ටිය දුරුකරන්ට;

විචිකිච්ඡං පහාතුං, විචිකිත්සාව දුරුකරන්ට; සීලබ්බතපරා
මාසං පහාතුං, ශීලව්‍රත පරාමර්ශනය හරින්ට; අභබ්බො,
නොපොහොසත්වේ; තයො, ( ඒ ) ධර්මතුණ; කතමෙ,
කවරහුද; අයොනිසොමනසිකාරං, නුනුවනින් මෙනෙහි
කිරීම; අප්පහාය, දුරුනොකොට; කුම්මග්ගසෙවනං, මිථ්‍යා
දෘෂ්ටිආදී කුමාර්ගීසෙවනය; අප්පහාය, දුරුනොකොට; චෙ
තසො ලීනත්තං; චිත්තයාගේ ලීනතාව; අප්පහාය, දුරු
නොකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙඛො තයොධම්මෙ,
මේ ධර්මතුණ; අප්පහාය, දුරු නොකොට; සක්කායදිට්ඨිං,
සක්කායදෘෂ්ටිය; පහාතුං, දුරුකරන්ටද; විචිකිච්ඡං පහාතුං,විචි
කිත්සාව දුරුකරන්ටද; සීලබ්බතපරාමාසං පහාතුං, ශීලව්‍රත
පරාමර්ශනයහරින්ටද; අභබ්බො, නොපොහොසත්වේ; භික්ඛ
වෙ, මහණෙනි; තයො ධම්මෙ, ධර්මතුණක්; අප්පහාය, දුරු
නොකොට; අයොනිසොමනසිකාරං පහාතුං, නුනුවනින්
මෙනෙහිකිරීම දුරුකරන්ටද; කුම්මග්ගසෙවනං පහාතුං,මිථ්‍යා
දෘෂ්ටිආදී කුමාර්ගීසෙවනය දුරුකරන්ටද; චෙතසොලීනත්තං,
චිත්තයාගේ ලීනතාව දුරුකරන්ටද; අභබ්බො, නොපොහො
සත්වේ; තයො, (ඒ) ධර්මතුණ; කතමෙ, කවරහුද; මුට්ඨස්ස
ච්චං, මුළාසිහිය; අප්පහාය, දුරුනොකොට; අසම්පජඤ්ඤං,
අපරීක්ෂාකාරීස්වභාව සඞ්ඛ්‍යාත අසම්පජඤ්ඤය, අප්පහාය, දුරු
නොකොට; චෙතසො වික්ඛෙපං, (නොයෙක් සිනිවිලිසිතන)
චිත්තවික්ෂෙපය; අප්පහාය, දුරුනොකොටත්ය; භික්ඛවෙ,මහ
ණෙනි; ඉමෙඛො තයොධම්මෙ, මේධර්මතුණ වනාහී; අප්ප
හාය, දුරුනොකොට; අයොනිසො මනසිකාරං පහාතුං,
නුනුවනින් මෙනෙහිකිරීම දුරුකරන්ටද; කුම්මග්ගසෙවනං
පහාතුං, කුමාර්ගී සෙවනය දුරුකරන්ටද; චෙතසො ලීන
ත්තං, චිත්ත ලීනතාව; පහාතුං, දුරුකරන්ටද; අභබ්බො,
නොපොහොසත්වේ; භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ,ධ
ර්මතුණක්;අප්පහාය,දුරුනොකොට;මුට්ඨස්සච්චං පහාතුං, මුළා
සිහිය දුරුකරන්ටද; අසම්පජඤ්ඤං පහාතුං, අසම්ප්‍රජඤ්ඤය
දුරුකරන්ටද; චෙතසොවික්ඛෙපං පහාතුං, චිත්තවික්ෂෙපය
දුරුකරන්ටද; අභබ්බො, නොපොහොසත්වේ; තයො,'(ඒ)
ධර්මතුණ; කතමෙ, කවරහුද; අරියානං, ආර්‍ය්‍යයන්ගේ; අදස්ස
නකම්‍යතං, නොදකිනුකැමැත්ත; අප්පහාය, දුරුනොකොට;
අරියධම්මස්ස අසොතුකම්‍යතං, ආර්‍ය්‍යධර්මය නොඅසනුකැ
මැත්ත; අප්පහාය, දුරුනොකොට; උපාරම්භචිත්තතං, රන්ධ්‍ර
ගවෙෂණ චිත්තයගෙවත් සිදුරුසොයනසිත; අප්පහාය, දුරු

නොකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙබො තයොධම්මෙ
මේධම්තුණ; අප්පහාය, දුරුනොකොට; මුට්ඨස්සච්චං පහාතුං
මුළා සිහිය නැතිකරන්ටද; අසම්පජඤ්ඤං, අසම්ප්‍රජඤ්ඤය;
පහාතුං, නැතිකරන්ටද; චෙතසොවික්ඛෙපං, චිත්තවික්ෂෙපය;
පහාතුං, නැතිකරන්ටද; අභබ්බො, නොපොහොසත්වේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධම්තුනක්; අප්ප
හාය, දුරුනොකොට; අරියානං, ආයභීයන්ගේ; අදස්සනකා
ම්‍යතං, නොදකිනුකැමැත්ත; පහාතුං, දුරුකරන්ටද; අරිය
ධම්මස්සඅසොතුකම්‍යතං, ආයභීධම්මය නොඅසනුකැමැත්ත;
පහාතුං, දුරුකරන්ටද; උපාරම්භචිත්තතං, සිදුරුසොයන සව
භාවඇතිසිත; පහාතුං, දුරුකරන්ටද; අභබ්බො, නොහැකි
වේ; තයො, (ඒ) ධම්තුණ; කතමෙ, කවරහුද; උද්ධච්චං, උඩඟු
සවභාව; අප්පහාය, දුරුනොකොට; අසංවරං, (චක්ඛුරාදී ඉඳු
රන් වැසීම්රහිතබවවූ) අසංවරය; අප්පහාය, දුරුනොකොට;
දුස්සීල්‍යං, දුස්සීලබව; අප්පහාය, දුරුනොකොටත්ය; භික්ඛ
වෙ, මහණෙනි; ඉමෙබොතයොධම්මෙ, මේධම්තුණ; අප්ප
හාය, දුරුනොකොට; අරියානම් දස්සනකම්‍යතං, ආයභීයන්
ගේ අදශීනකම්‍යතාව; පහාතුං, දුරුකරන්ටද; අරියධම්මස්ස
අසොතුකම්‍යතං, අරිදම් නොඅසනුකැමැත්ත; පහාතුං, දුරු
කරන්ටද; උපාරම්භ චිත්තතං, උපාරම්භ චිත්තය; පහාතුං,
දුරුකරන්ටද; අභබ්බො, නොපොහොසත්වේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධම්තුනක්; අප්ප
හාය, දුරුනොකොට; උද්ධච්චංපහාතුං, ඖද්ධත්‍යය දුරුකරන්
ටද; අසංවරංපහාතුං, අසංවරය දුරුකරනට; දුස්සීල්‍යං පහා
තුං දුස්සීලබව දුරුකරන්ටද; අභබ්බො, නොහැකිවේ; තයො,
(ඒ) ධම්තුණ; කතමෙ, කවරහුද; අස්සද්ධියං, අශ්‍රද්ධා යො
ගය; අප්පහාය, දුරුනොකොට; අවදඤ්ඤුතං, දන්නොදෙන
සවභාව; අප්පහාය, දුරුනොකොට; කොසජ්ජං, අලසබව;
අප්පහාය, දුරුනොකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙබො
තයොධම්මෙ, මේධම්තුණ; අප්පහාය, දුරුනොකොට; උද්ධ
ච්චංපහාතුං. උඩඟුබැව් දුරුකරන්ටද; අසංවරංපහාතුං, අසං
වරය දුරුකරන්ටද; දුස්සීල්‍යංපහාතුං, දුශ්සීලසවභාව දුරුක
රන්ටද; අභබ්බො, නොහැකිවේ; භික්ඛවෙ, මහණෙනි;
තයොධම්මෙ, ධම්තුනක්; අප්පහාය, දුරුනොකොට; අස්ස
ද්ධියංපහාතුං, අශ්‍රද්ධායොගය දුරුකරන්ටද; අවදඤ්ඤුතං,
අදාන සවභාව; පහාතුං, දුරුකරන්ටද; කොසජ්ජං පහාතුං,
අලසබැව් දුරුකරන්ටද; අභබ්බො, නොහැකිවේ; තයො;

( ඒ ) ධම්මතුණ; කතමෙ, කවරහුද; අනාදරියං, අනාදර ක්‍රියාශෙහියෙදීම, අප්පහාය, දුරු නොකොට; දෞවචස්සතං, නොකීකරු සවභාව; අප්පහාය, දුරු නොකොම; පාපමිත්තතං, පාපයන්හා මිත්‍රවනසවභාව; අප්පහාය, දුරු නොකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙඛො තයොධමෙම, මේධම්මතුණ; අප්පහාය, දුරු නොකොට; අස්සද්ධියං, අශ්‍රද්ධාවෙන් යුක්ත වීම; පහාතුං, දුරු කරන්වද; අවදඤ්ඤුතං, අදානශීලත්වය; පහාතුං, දුරු කරන්වද; කොසජ්ජං, කුසීතබැව්; පහාතුං, දුරු කරන්වද; අභබ්බො, නොහැකිවේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධමෙම, ධම්මතුණක්; අප්පහාය, දුරු නොකොට; අනාදරියං, අනාදරක්‍රියාශෙහි යෙදීම; පහාතුං, දුරු කරන්වද; දෞවචස්සතං, නොකීකරුබැව්; පහාතුං, දුරු කරන්වද; පාපමිත්තතං, පව්වන්හා මිතුරුබැව්; පහාතුං, දුරු කරන්වද; අභබ්බො, නොහැකිවේ; තයො, (ඒ) ධම්මතුණ; කතමෙ, කවරහුද; අහිරිකං, පාපකරණයෙහි විළිනැතිබැව්; අප්පහාය, දුරු නොකොට; අනොත්තප්පං, පාපකරණයෙහි බියනැතිබැව්; අප්පහාය, දුරු නොකොට; පමාදං, ස්මෘතිවිප්‍රවාස සංඛ්‍යාත ප්‍රමාදය; අප්පහාය, දුරු නොකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙඛො තයො ධමෙම, මේ ධම්මතුණ; අප්පහාය, දුරු නොකොට; අනාදරියං, අනාදරකරණයෙන් යෙදීම; පහාතුං, දුරු කරන්වද; දෞවචස්සතං, නොකීකරු බැව්; පහාතුං, දුරු කරන්වද; පාපමිත්තතං, පාපයන්හා මිතුරු බැව්; පහාතුං, දුරු කරන්වද; අභබ්බො, නොහැකිවේ.

භික්ඛවෙ, මහණෙනි; අහිරිකො, පාපකරණයෙහිවිළිනැති; අනොත්තප්පී, පාපකරණයෙහි බියනැති; අයං, මේපුද්ගල තෙම; පමත්තො හොති, ප්‍රමාදවේ; පමත්තො සමානො, ප්‍රමාදයෙක්වූම; සො, හේතෙම; අනාදරියං, අනාදරක්‍රියායෙහි යෙදීම; පහාතුං, [illegible] ද; දෞවචස්සතං, නොකීකරුබැව්; පහාතුං, දුරු කරන්වද; පාපමිත්තතං, පාපයන්හා මිතුරු බැව්; පහාතුං, දුරු කරන්වද; අභබ්බො, (පාපකර්මයෙහි සංශක්තහෙයින්) නොහැකිවේ; සො, හෙතෙම; පාපමිත්තො සමානො, පාපමිත්‍රයන් ඇතිවූයේම; අස්සද්ධියං, අශ්‍රද්ධායෙහියෙදීම; පහාතුං, දුරු කරන්වද; අවදඤ්ඤුතං, අප්‍රදානභාවය; පහාතුං, දුරු කරන්වද; කොසජ්ජං, කුසීදබැව්; පහාතුං, දුරු කරන්වද; අභබ්බො, නොපොහොසත්වේ; සො කුසීතො සමානො, කුසීතවූම හෙතෙම; උද්ධච්චං, උද්ධු

බැව්; පහාතුං, දුරුකරන්වද; අසංවරං, ඉඳුරන් නොවැසීම
යයි කියනලද අසංවරය; පහාතුං. දුරුකරන්වද; දුස්සීල්‍යං
දුස්සීලභාවය; පහාතුං, දුරුකරන්වද; අභබ්බො, නොපො
හොසත්වේ; සොදුස්සීලො සමානො, හෙතෙම දුස්සීලවූ
යේම; අරියානං, ආර්යයන්ගේ; අදස්සනකම්‍යතං, නොදැ
කිනු කැමැත්තයයි කියනලද; අදර්ශනකම්‍යතාව; පහාතුං,
දුරුකරන්වද; අරියධම්මස්ස අසොතුකම්‍යතං, ආර්‍යධර්මය
නොඅසනු කැමැත්ත; පහාතුං, දුරුකරන්වද; උපාරම්භ
චිත්තතං, උපාරම්භචිත්ත ස්වභාව; පහාතුං, දුරුකරන්වද;
අභබ්බො, නොපොහොසත්වේ; සො උපාරම්භචිත්තො
සමානො; අනුන්සිදුරුසොයන සිත්ඇති හෙතෙමේම; මුට්ඨ
සච්චං, මුළාසිහිය; පහාතුං, දුරුකරන්වද; අසම්පජඤ්ඤං, නුව
ණින් නොසැලකීමයයි කියනලද අසම්පජඤ්ඤය; පහාතුං,
දුරුකරන්වද; චෙතසො, චිත්තයාගේ; වික්ඛෙපං, වික්ෂෙපය;
පහාතුං, දුරුකරන්වද; අභබ්බො, නොපොහොසත්වේ; සො
වික්ඛිත්තචිත්තො සමානො, වික්ෂිප්තසිත් ඇති හෙතෙමේම;
අයොනිසො මනසිකාරං,. නුනුවනින් මෙනෙහිකිරීම; පහා
තුං, දුරුකරන්වද; කුම්මග්ගසෙවනං, මිථ්‍යාදෘෂ්ටිආදී කුමාර්ගී
සෙවනය; පහාතුං, දුරුකරන්වද; චෙතසොලීනත්තං, චිත්ත
යාගේ අකර්මණ්‍යතාව; පහාතුං, දුරුකරන්වද; අභබ්බො,
නොපොහොසත්වේ; සොලීනචිත්තො සමානො, අකර්මණ්‍ය
සිත්ඇති හෙතෙමේම, සක්කායදිට්ඨිං, සක්කායදෘෂ්ටිය; පහා
තුං, දුරුකරන්වද; විචිකිච්ඡං, බුද්ධාදීන්කෙරෙහි සැකය;
පහාතුං, දුරුකරන්වද; සීලබ්බතපරාමාසං, ශීලව්‍රතයන් පරා
මර්ශනයකිරීම; පහාතුං, දුරුකරන්වද, අභබ්බො, නොහැකි
වේ; සොවිචිකිච්ඡො සමානො, ඒසැකකරණුයේම; රාගංපහා
තුං, රාගයදුරුකරන්වද; දොසංපහාතුං, ද්වේෂයදුරුකරන්වද;
මොහංපහාතුං, මොහයදුරුකරන්වද; අභබ්බො, නොපො
හොසත්වේ; සො, හේතෙම; රාගංඅප්පහාය, රාගයදුරු
නොකොට; දොසංඅප්පහාය, ද්වේෂයදුරුනොකොට; මො
හංඅප්පහාය, මොහය දුරුනොකොට; ජාතිංපහාතුං, ඉපදීම
නැතිකරන්වද; ජරංපහාතුං, ජරාවදුරුකරංවද; මරණංපහා
තුං, මැරීමනැතිකරන්වද; අභබ්බො, අභව්‍යවේ(නොහොත්)
පොහොසත් නොවේ.

ත්‍රිභුවන නිඛිලජනරාජ සර්වගුණරත්නනිධිනිකෙතවූ සුගත
තථාගතයන් වහන්සේ යම් ධර්මදෙශනාසමයෙක්හි සැවැත්
නුවරනිසා, අනේපිඬුමහසිටානු විසින් කරවා පිළිගන්වන
ලද දෙව්රම්හි වැඩවසනසේක්ද, එසමයෙහි භාග්‍යවතුන්

වහන්සේ සසරබියදක්නෙනි හෙවත් මහණෙනි කියා භික්ෂූන් කැඳවූසේක, ඒ ආමන්ත්‍රණයලැබූ සසරබියදක්නා භික්ෂූහු සර්‍වඥයන්දසාවට දෙගොත්මුදුන්දී නැමී කිමෙක්ද පින්වතුන් වහන්සැයි පිළිවදන් ඇස්සූහ සම්බුද්ධාමන්ත්‍රණයට පිළිවදන්දී සද්ධර්‍මශ්‍රවණයට සූසැදීසිටි සසරභයදක්නා භික්ෂූන්ට සර්‍වඥයන්වහන්සේ මනුජ සුරාසුරොරග ශ්‍රවණජන කර්‍ණරසායනාමෘතප්‍රකාශවනා මධුරධර්‍මය ශ්‍රොතෘජන කර්‍ණයන්හි අමාවන් කරන්නාසේ දෙශනාකළසේක, කෙසේදයත් මහණෙනි ලෙව්හි ධර්‍මතුණක් විද්‍යමාන නොවන්නාහුනම් තථාගතෝතනමයෙක් පහළනොවන්නේය ලෙව්හි තථාගත ප්‍රවෙදිත ධර්‍මවිනය නොබබලන්නේය ඒ කවර ධර්‍මතුණෙක්දයත්, ඉපදීමය, දිරීමය, මැරීමය, යනතුණයි මහණෙනි මේධර්‍මතුණ ලෙව්හි නොපවත්නාහුනම් තථාගතො නාමයෙක් ලොව පහළනොවන්නේය තථාගත ප්‍රවෙදිත ධර්‍මවිනය ලොව නොබබලන්නේහෝ ප්‍රකාශනොවන්නේය, යම්හෙයකින් මේඉපදීමය, දිරීමය, මැරීමය, යනධර්‍මතුන ලොවපවතීද්ද, එහෙයින් තථාගතතෙමේ ලොකයෙහි පහළ වෙයි, එහෙයින්ම තථාගත ප්‍රවෙදිත ධර්‍මවිනය ලොකයෙහි බබලයි.

එම්බා සසරබියදක්ණෙනි රාග ද්වෙෂ මොහයන් තිබියදී, ජාතිජරාමරණයෙන් නොමිදිය හැකිය. සත්කායදෘෂ්ටි විචිකිච්ඡා සීලබ්බතපරාමාස සංයොජනයන් තිබියදී, රාගද්වෙෂ මොහයන් පහනොකොටහැකිය අයොනිසොමනස්කාරය කුමාර්‍ගී සෙවනය චිත්ත අකල්‍යතාවය යන මොවුන් දුරු නොකොට, සත්කායදෘෂ්ටිය විචිකිච්ඡාය සීලබ්බතපරාමාසය යන මොවුන් දුරුනොකොට හැකිය, මුළාසිහියහා නුනුවණින් යෙදී පැවතීම නොයෙක් අරමුණුකරා සිත යැවීම නොහැර අයොනිසො මනසකාරාදීන් දුරුනොකොටහැකිය, ආර්‍ය්‍යයන් නොදකිනු කැමැත්ත ආර්‍ය්‍ය ධර්‍මය නොඅසනු කැමැත්ත රන්ධ්‍රගවෙෂණතාව හෙවත් අනුන් සිදුරු සොයනසිත දුරු නොකොට මුට්ඨස්සච්චාදීන් නොහළ හැකිය, උද්ධච්චබව ඉඳුරන් නොවැසීම දුසිල්බව නොහැර ආර්‍ය්‍යාන්‍ශීන කම්‍යතාදීන් නොහළ හැකිය, අශ්‍රද්ධාවෙන් යෙදීම දෘානි සංඝ නොදන්නා බව කුසීතබව යනධර්‍ම අත්නොහැර උද්ධච්චාදීන් දුරුනොකොට හැකිය, අනාදරකිරීම, නොකීකරුබව පවිටු මිතුරන්සෙවීම, යන ධර්‍මයන් නොහැර, අශ්‍රද්ධිය යනාදීන් දුරුනොකොට හැකිය, පාපකරණයෙන් විළිනැති බව කල්‍යාණධර්‍මවිෂයෙහි නොඑළඹි සිටි සිහියසිකිඵනාලද ප්‍රමාද

ධර්මයන් නොහැර අනාදරියාදි ධර්මයන් දුරු නොකොටගැ
නීය-හිරිඔතප් නැත්තේ සමෘති විප්‍රවාස සංඛ්‍යාත ප්‍රමාදයෙන්
යුක්තවේ, ඒ ප්‍රමාද සමඞ්ගීපුද්ගලතෙම අනාදරියය නො
කීකරුබවය පාපමිත්‍ර සේවනය යනධර්මයන් දුරු නොකෙ
රෙයි, ඒ පාපමිත්‍රසේවනයෙන් යුක්තවන්නේ අශ්‍රද්ධාවය අවදඥ
තාවය, කුසීතත්වය, යන ධර්මයන් දුරුනොකෙරෙයි ඒ ආල
ස්‍ය යෙන්යුක්ත පුද්ගලයා උඩඟුබවය ඉඳුරන් නොවැසීමය
දුසිල්බවය යනපාපධර්මයන් දුරුනොරකරෙයි, ඒ දුස්සීල
භාවයෙන් යුක්තවනුයේ ආර්‍ය්‍යාදර්ශන කාම්‍යතාවය ආර්‍ය්‍යධර්මය
නොඅසනු කැමැත්තය රන්ධ්‍රගවේෂණ චිත්තය යන පාප
ධර්මයන් දුරුනොකෙරෙයි, ඒ රන්ධ්‍රගවේෂණ චිත්තයෙන්
යුක්තවන්නේ මුට්ඨස්සච්චය අසම්පජඤ්ඤය චිත්තවික්ෂේපය
යන ධර්මයන් දුරු නොකෙරෙයි, ඒ චිත්තවික්ෂේපයෙන්
යුක්තවනුයේ අයෝනිසො මනස්කාරය මිථ්‍යාදෘෂ්ටි ආදි කු
මාර්ගී සේවනය චිත්තයාගේ අකර්මණ්‍යතාවය යන ධර්මයන්
දුරුනොකෙරෙයි, ඒ ලීනචිත්තයෙන් යුක්තවනුයේ සක්කා
දෘෂ්ටිය විචිකිච්ඡාව සීලබ්බතපරාමාසය යන ධර්මයන් දුරු
නොකෙරෙයි, ඒ විචිකිච්ඡාවෙන් යුක්තවනුයේ රාගය ද්වේෂ
මෝහය යන ක්ලේශයන් දුරුනොකෙරෙයි, ඒ රාග ද්වේෂ
මෝහයන්ගෙන් යුක්තවනුයේ ජාතිජරා මරණාදි දුක්ට හා
ජනම සසර බොහෝ දික්වීමෙන් අනන්ත අප්‍රමාණ දුක්
විඳින්නේය යනු මෙහි භාවයි,

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධර්මතුනක්; පහාය,
දුරුකොට; ජාතිංපහාතුං, ඉපදීම නැතිකරන්ටද; ජරංපහා
තුං, දිරීමනැතිකරන්ටද; මරණංපහාතුං, මැරීමනැතිකරන්
ටද; භබ්බො, භව්‍යවේ නොහොත් හැකිවේ; තයො, ඒ
ධර්මතුණ; කතමෙ, කවරහුද; රාගංපහාය, රාගය දුරුකොට;
දෝසංපහාය, ද්වේෂයදුරුකොට; මෝහංපහාය, මෝහයදුරු
කොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙඛො තයොධම්මෙ,
මේ ධර්මතුණ; පහාය, දුරුකොට; ජාතිංපහාතුං, ඉපදීම නැති
කරන්ටද; ජරංපහාතුං, දිරීම නැතිකරන්ටද; මරණංපහා
තුං, මැරීම නැතිකරන්ටද; භබ්බො, භව්‍යවේ නොහොත්
හැකිවේ—භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධර්මතුණක්;
පහාය, දුරුකොට; රාගංපහාතුං, රාගය දුරුකරන්ටද; දෝ
සංපහාතුං, ද්වේෂය දුරුකරන්ටද; මෝහංපහාතුං, මෝහය
පහකරන්ටද; භබ්බො, භව්‍යවේ; (හෙවත්) හැකිවේ. තයො
ඒ ධර්මතුණනම්; කතමෙ, කවරහුදයත්; සක්කායදිට්ඨිං,

සක්කායදෘෂ්ටිය නොහොත් තමන්කය කෙරෙහි මමය මා
ගේය කියා වරදවා සිතීම; පහාය, දුරුකොට; විචිකිච්ඡං,
බුද්ධාදීඅටතැන්හි කරණසැකය; පහාය, දුරුකොට; සීලබ්බ
තපරාමාසං, බාහිර ශීලව්‍රත පරාමර්ශනය; නොහොත් සමා
දානය; පහාය, දුරුකොටත්ය, භික්ඛවෙ, මහණෙනි; ඉමෙ
ඛො තයො ධම්මෙ, මේධම්මතුණ වනාහි; පහාය, දුරුකොට;
රාගං පහාතුං, රාගයදුරුකරන්ටද; දෝසං පහාතුං, වෙෂයදුරු
කරන්ටද; මොහං පහාතුං, මොහය දුරුකරන්ටද; භබ්බො,
භව්‍යවේ (නොහොත් හැකිවේ) භික්ඛවෙ, මහණෙනි; ත
යොධම්මෙ, ධම්මතුණක්; පහාය, දුරුකොට; සක්කායදිට්ඨිං,
සක්කාය දෘෂ්ටිය; පහාතුං, දුරුකරන්ටද; විචිකිච්ඡං, විචිකිත්
සාව; පහාතුං, පහකරන්ටද; සීලබ්බත පරාමාසං, ශීලව්‍රතපරා
මශිනය; පහාතුං, ප්‍රහානයකරන්ටද; භබ්බො, භව්‍යවේ(හෙ
වත්) හැකිවේ; තයො, ඒ ධම්මයෝ තුන්දෙන; කතමෙ,
කවරහුදයත්; අයොනිසො මනසිකාරං, නුනුවනින් මෙනෙහි
කිරීම; පහාය, හැර; කුම්මග්ගසෙවනං, කුමාර්ගසෙවනය;
පහාය, හැර; චෙතසොලීනත්තං, චිත්තාකල්‍යතාව; පහාය,
හැරත්ය, භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො තයො ධම්මෙ, මෙ
සීධම්මතුණ, පහාය, දුරුකොට; සක්කායදිට්ඨිං, සක්කායදෘෂ්ටිය
පහාතුං, දුරුකරන්ටද; විචිකිච්ඡං, විචිකිත්සාව; පහාතුං, දුරු
කරන්ටද; සීලබ්බතපරාමාසං, බාහිර ශීලව්‍රත සමාදානය;
පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ; (හෙවත්) හැකි
වේ. භික්ඛවෙ, මහණෙනි; තයො ධම්මෙ, ස්වභාව ධම්ම
තුණක්; පහාය, දුරුකොට; අයොනිසො මනසිකාරං, අනු
පාය මනස්කාරය; පහාතුං, ප්‍රහකරන්ටද; කුම්මග්ගසෙවනං,
මිථ්‍යාදෘෂ්ටිආදී අයහපත් මාර්ග සෙවනයකිරීම; පහාතුං, දුරු
කරන්ටද; චෙතසොලීනත්තං, චිත්තාකර්මණ්‍යතාව (නො
හොත්) කාමාසාවෙන් චිත්තයාගේ නොසන්සිඳීම; පහාතුං,
දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ, (හෙවත්) හැකිවේ; තයො
ඒ ත්‍රිවිධධම්මයෝ; කතමෙ, කවරහුද; මුට්ඨස්සච්චං, හිතාශි
නාදී ධම්මයන්නොදන්නා අශුභභාවය; පහාය, දුරුකොට;
අසම්පජඤ්ඤං, ස්ථානගමනාදියෙහි සමෘති විප්‍රයුක්තතාවය;
පහාය, දුරුකොට; චෙතසො විඛෙපං, (ඖද්ධත්‍යය කර
ණකොටගෙණ) චිත්තයාගේ විසිරපැවැත්ම; පහාය, දුරු
කොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො තයො ධම්මෙ;
මේධම්මතුණ වනාහි; පහාය, දුරුකොට; අයොනිසො මනසි
කාරං, නොමග මෙනෙහිකිරීම; පහාතුං, දුරුකරන්ටද;

ඝසෙවනං, කුම්මාගීසෙවනය; පහාතුං, දුරුකරන්ටද;
චෙතසොලීනත්තං, චිත්තයාගේ ලීනභාවය; පහාතුං, දුරු
කරන්ටද; භබ්බො, භව්‍යවේ හෙවත් හැකිවේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධම්මතුණක්; පහාය,
දුරුකොට; මුට්ඨස්සච්චං, මුළාසිහිය; පහාතුං, දුරුකරන්ටද; අස
මපජඤ්ඤං, අසම්ප්‍රජන්‍යය; පහාතුං, දුරුකරන්ටද; චෙතසො
වික්ඛෙපං, චිත්තවික්ෂෙපය; පහාතුං, දුරුකරන්ටද; භබ්බො,
භව්‍යවේ හෙවත් හැකිවේ; තයො, ඒ ධම්මතුණ; කතමෙ,
කවරහුද; අරියානං, බුඞාදී ආය්‍යීයන්ගේ; අදස්සනකම්‍යතං,
නොදක්නු කැමත්තද; පහාය, දුරුකොට; අරියධම්මස්ස
අසොතුකම්‍යතං, සතරසතිපට්ඨානාදී ආය්‍යීධම්මයන් නොඅ
සනුකැමැත්තද; පහාය, දුරුකොට; උපාරම්භචිත්තතං,
අනුන්සිදුරුසොයා අවඥකරණසිත; පහාය, දුරුකොටත්ය;
භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො තයො ධම්මෙ, මේධම්
තුණ; පහාය, දුරුකොට; මුට්ඨස්සච්චං පහාතුං, මුළාසිහිය දුරු
කරන්ටද; අසම්පජඤ්ඤං, අසම්ප්‍රජන්‍යය; පහාතුං, දුරුකරන්
ටද; චෙතසො වික්ඛෙපං, චිත්තවික්ෂෙපය; පහාතුං, දුරු
කරන්ටද; භබ්බො, භව්‍යවේ.

භික්ඛවෙ, මහණෙනි; තයො ධම්මෙ, ධම්මතුණක්; පහාය,
දුරුකොට; අරියානං; ආය්‍යීයන්ගේ; අදස්සනකම්‍යතං, නො
දක්නුකැමැතිබව; පහාතුං, දුරුකරන්ටද; අරියධම්මස්ස අ
සොතු කම්‍යතං, ආය්‍යීධම් නොඅසනුකැමතිබව; පහාතුං,
දුරුකරන්ටද; උපාරම්භචිත්තතං, සිදුරුසොයන සිත්ඇති
බව; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ. තයො, ඒ
ධම්මතුණ; කතමෙ, කවරහුද; උද්ධච්චං, උඩඟුබවද; පහාය,
දුරුකොට; අසංවරං, චක්ඛුරාදී ඉඳුරන් නොවැස්මයයි කියන
ලද අසංවරය; පහාය, දුරුකොට; දුස්සීල්‍යං, දුසිතවූහෝ
සිල්නැතිබව; පහාය, දුරුකොටත්ය; භික්ඛවෙ, මහණෙනි;
ඉමෙ ඛො තයො ධම්මෙ, මේධම්මතුණවනාහි, පහාය, දුරු
කොට; අරියානං, ආය්‍යීයන්ගේ; අදස්සනකම්‍යතං, නොද
ක්නුකැමතිබැව්; පහාතුං දුරුකරන්ටද; අරියධම්මස්ස අසො
තුකම්‍යතං, ආය්‍යීධම්මය නොඅසනුබැව්; පහාතුං, දුරුකරන්
ටද; උපාරම්භචිත්තතං, උපාරම්භ චිත්තතාව; පහාතුං, දුරු
කරන්ටද; භබ්බො, භව්‍යවේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධම්මතුණක්; පහාය;
දුරුකොට; උද්ධච්චං පහාතුං, උඩඟුබව දුරුකරන්ටද; අසං
වරං පහාතුං, අසංවරය දුරුකරන්ටද; දුස්සීල්‍යං පහාතුං,

දුශ්ශීල්‍යභාව දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ; තයො, ඒධම්ම තුණ; කතමෙ, කවරහුද; අස්සද්ධියං, අශ්‍රද්ධාවෙන් යුක්ත වීම; පහාය, හැර; අවදඤ්ඤුතං, දන්දීමෙහි අනිසංස නොදන්නාබව; පහාය, දුරුකොට; කොසජ්ජං, ආලස්‍යය; පහාය, දුරුකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො. තයොධම්මෙ, මේධම්මතුණ; පහාය, හැර; උද්ධච්චං, උඩඟුබව; පහාතුං, හරින්ටද; අසංවරං, අසංවරය; පහාතුං, හරින්ටද; දුස්සීල්‍යං, දුසිල්බව; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධම්මතුණක්; පහාය දුරුකොට; අස්සද්ධියං, අශ්‍රද්ධාවෙන් යෙදීම; පහාතුං, දුරු කරන්ටද; අවදඤ්ඤුතං, අපණ්ඩිතභාවය; පහාතුං, දුරුකරන්ටද; කොසජ්ජං, ආලස්‍යය; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ. තයො, ඒධම්මතුණ; කතමෙ, කවරහුද; අනාදරියං, අනාදරකරණයෙන් යුක්තතාව; පහාය, දුරුකොට; දොවචස්සතං, නොකීකරුබව; පහාය, දුරුකොට; පාපමිත්තතං, පාපයන්හා මිත්‍රබව; පහාය, දුරුකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො තයො ධම්මෙ, මේධම්මතුණවනාහී; පහාය, දුරුකොට; අස්සද්ධියං, අශ්‍රද්ධාවෙන් යුක්තවීම; පහාතුං, දුරුකරන්ටද; අවදඤ්ඤුතං, අදානසීලීබව; පහාතුං, දුරුකරන්ටද; කොසජ්ජං, කුශලධම්මයන් සොයාරැස්කිරීමෙහි ආලස්‍යය; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ හෙවත්හැකිවේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධම්මතුණක්; පහාය, දුරුකොට; අනාදරියං, අචිත්තීකාරකරණ සඞ්ඛ්‍යාත අගෞරවය; පහාතුං, දුරුකරන්ටද; දොවචස්සතං, නොකීකරුබව; පහාතුං, දුරුකරන්ටද; පාපමිත්තතං, පාපයන්හා මිත්‍රබව; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ. තයො, ඒධම්ම තුණ; කතමෙ, කවරහුද; අනාදරියං, අනාදරකරණයෙන් යුක්තවීම; පහාය, දුරුකොට; දොවචස්සතං, නොකීකරුබව; පහාය, දුරුකොට; පාපමිත්තතං, පාපයන්හා මිතුරුබව; පහාය, දුරුකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙඛො තයොධම්මෙ, මේ ධම්මතුණවනාහී; පහාය, දුරුකොට; අස්සද්ධියං, අශ්‍රද්ධාවෙන් යෙදීම; පහාතුං, හරින්ටද; අවදඤ්ඤුතං, දන්නොදෙන ස්වභාව; පහාතුං දුරුකරන්ටද; කොසජ්ජං, කුසීතබැව්; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ.

භික්ඛවෙ, මහණෙනි; තයොධම්මෙ, ධම්මතුණක්; පහාය,

හැර; අනාදරියං, අනාදරකිරීම; පහාතුං, දුරුකරන්ටද; දෝවචස්සතං, නොකීකරුබැව්; පහාතුං, දුරුකරන්ටද; පාපමිත්තතං, පාපයන්හා මිතුරුබැව්; පහාතුං, දුරුකරන්වද; භබ්බො, භව්‍යවේ; තයො, ඒධර්මතුණ; කතමෙ, කවරහුද; අහිරිකං, ලාමකපව්කිරීමෙහි ලජ්ජානොවීම; පහාය, දුරුකොට; අනොත්තප්පං, පාපකර්මයක් කරන්ට සිතුනකල ආදීනවසිතා බියනොවීම; පහාය, දුරුකොට; පමාදං, ප්‍රමාදය; පහාය, දුරුකොටත්ය; භික්ඛවෙ, මහණෙනි; ඉමෙබො තයොධම්මෙ, මේධර්මතුණ වනාහි; පහාය, දුරුකොට; අනාදරියං පහාතුං, අනාදකිරීම දුරුකරන්වද; දොවචස්සතං, නොකීකරුබව; පහාතුං දුරුකන්වද; පාපමිත්තතං, පාපයන්හා මිතුරුබව; පහාතුං, දුරුරන්වද; භබ්බො, භව්‍යවේ.

භික්ඛවෙ, මහණෙනි; හිරිමා, පාපකාරණයෙහි විළිඇත්තාවූ; ඔත්තප්පී, පාපයෙහි බියඇත්තාවූ; අයං, මේසත්වතෙම අප්පමත්තො හොති, කල්‍යාණ ධර්මවිෂයෙහි එළඹසිටි සිත් ඇතිහෙයින් නොපමාවේ. සොඅප්පමත්තො සමානො, ඒ නොපමාවූයෙම; අනාදරියං, අනාදරකිරීම; පහාතුං, දුරුකරන්වද; දොවචස්සතං, නොකීකරුබව; පහාතුං, දුරුකරන්ටද; පාපමිත්තතං, පාපයන්හා මිතුරුබැව්; පහාතුං, දුරුකන්ටද; භබ්බො, භව්‍යවේ; සො කල්‍යාණමිත්තො සමානො, ඒ කල්‍යාණමිත්‍රයන් ඇත්තේම; අස්සද්ධියං, බුද්ධාදීන් නොඇදහීම් සඞ්ඛ්‍යාත අශ්‍රද්ධාව, පහාතුං, දුරුකරන්ටද; අවදඤ්ඤුතං, අදානසීලීබව; පහාතුං, දුරුකරන්ටද; කොසජ්ජං, කුසීදබැව්; පහාතුං, දුරුකරටද; භබ්බො, භව්‍යවේ; සො ආරද්ධවිරියො සමානො, ඒ පටන්ගත්නාලද වීර්‍ය්‍යඇති හෙතෙමේම; උද්ධච්චං, උද්ධතබව; පහාතුං, දුරුකරන්ටද; අසංවරං, අසංවරය; පහාතුං, දුරුකරන්ටද; දුස්සීල්‍යං, දූසිතසිල් ඇතිබව; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ. සොසීලවාසමානො, ඒ සිල්වත්වනුයේම; අරියානං, ආර්‍ය්‍යයන්ගේ; අදස්සනකම්‍යතං, අදර්ශනකම්‍යතාව; පහාතුං, දුරුකරන්ටද; අරියධම්මස්ස අසොතුකම්‍යතං, ආර්‍ය්‍යධර්මයන් නොඅසනු කැමතිබව; පහාතුං, දුරුකරන්ටද; උපාරම්භ චිත්තතං, අනුන්සිදුරුසොයන සිත්ඇතිබව; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ, සො අනුපාරම්භචිත්තො සමානො, ඒ අනුපාරම්භචිත්තය ඇතිවූයේම; මුට්ඨස්සච්චං, මුළාසිහිය; පහාතුං, දුරුකරන්වද; අසම්පජඤ්ඤං, සම්‍යක් ප්‍රඥානැතිබව; පහාතුං, දුරුකරන්ටද; චෙතසො වික්ඛෙපං, චිත්තවික්ෂෙපය;

පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ. සො අවික්ඛිත්ත චිත්තො සමානො, ඒ අවික්ෂිප්ත සිත්ඇතිවූයේම; අයොනිසොමනසිකාරං, නුනුවණින් මෙනෙහිකිරීම; පහාතුං, දුරුකරන්ටද; කුම්මග්ගසෙවනං, කුම්මාර්ගසෙවනය; පහාතුං, දුරුකරන්ටද; චෙතසො ලීනත්තං, චිත්තයාගේ ලීනභාවය; පහාතුං, දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ. සොඅලීනචිත්තො සමානො, ඒ කල්‍යචිත්තය ඇතිවූයේම; සක්කායදිට්ඨිං, සත්කායදෘෂ්ටිය; පහාංතු, දුරුකරන්ටද; විචිකිච්ඡං, බුද්ධාදීන්කෙරෙහි සැකය; පහාතුං, දුරකරන්ටද; සීලබ්බතපරාමාසං, ශීලව්‍රත පරාමර්ශනය; පහාතුං, දුරුකරන්ටද; භබ්බො භව්‍යවේ.

සො අවිචිකිච්ඡො සමානො, ඒ සැකනැත්තේම; රාගං පහාතුං, රාගයදුරුකරන්ටද; දොසං පහාතුං, ද්වේෂය දුරුකරන්ටද; මොහං පහාතුං, මොහය දුරුකරන්ටද; භබ්බො, භව්‍යවේ. සො, ඒ පුද්ගලතෙම; රාගංපහාය, රාගය දුරුකොට; දොසං පහාය, ද්වේෂය දුරුකොට; මොහං පහාය, මොහය දුරුකොට; ජාතිං, සසරඉපදීම; පහාතුං, දුරුකරන්ටද; ජරං පහාතුං, ජරාව දුරුකරන්ටද; මරණංපහාතුං, මරණය දුරුකරන්ටද; භබ්බො ඉති, භව්‍ය වේයයි; නොහොත් හැකි වේයයි වදාළසේක.

එම්බා සසරබියදක්නා මහණෙනි, රාගය ද්වේෂය මොහය යන කෙලෙශයන් දුරුකළකල්හි, ජාතිය ජරාය මරණය යන දුක්නූපදිත් සත්කායදෘෂ්ටිය, විචිකිච්ඡාය, ශීලව්‍රත පරාමර්ශනය යන කෙලෙශයන් දුරුකළකල්හි, රාගය ද්වේෂය, මොහය, යන කෙලෙශයන් නූපදිත්, නුනුවණින්, මෙනෙහිකිරීමය, මිත්‍යාදෘෂ්ටිආදීන් නොසෙවීමය. යහපතට නොනැමී සිතසැඟවීමය; යන ධර්මයන් දුරුකළ කල්හි සත්කා දෘෂ්ටිආදි කෙලෙශයෝ නූපදිත් මුළා සිහිය යනාදී ධර්මතුණ දුරුකළ කල්හි අයොනිසො මනසකාරාදි කෙලෙශයෝ නූපදිත්, ආර්‍යයාදර්ශන කාම්‍යතාදි ධර්මයන් දුරුකළ කල්හී, මුළාසිහිය යනාදි කෙලෙශයන් නූපදීත් උඩඟු බවය යනාදී ධර්මයන් දුරුකළ කල්හි ආර්‍යයාදර්ශන කාම්‍යතාදි ධර්මයන් දුරුකරන්ට හැක්කේය අශ්‍රද්ධා සඞ්ඛ්‍යාත ධර්මයන් දුරුකළා හට උද්ධච්චාදි ධර්මයන් දුරුකළ හැක්කේය අනාදරකිරීමෙහි යෙදීමය යනාදි ධර්මයන් දුරුකළාහට අශ්‍රද්ධාදි ධර්මයන් දුරුකළ හැක්කේය අහිරිකාදි ධර්මයන් දුරුකළා හට අනාදරියාදි ධර්මයන් දුරුකළහැක්කේය පච්කිරීමෙහි ගිරිඔතප් ඇත්තේ කුශලක්‍රියාවෙහි නොපමාවේ, නොපමාවූයේ අනාදරකිරීමය නොකී

කරු බවය, පාපමිත්‍ර සෙවනය යනධර්මයන් දුරුකෙරෙයි; ඒ කල්‍යාණමිත්‍රයන් සෙවියේ, අශ්‍රද්ධාවය, අඥානසිල්භාවය අලස බවය යන ධර්මයන් දුරුකෙරෙයි, ඒ වීර්‍ය්‍යකරණයෙන් යුක්තවූයේ උඩඟුබවය ඉඳුරන් නොවැසීමයයි කියනලද අසංවරය, දුශ්ශීල භාවය, යන ධර්මයන් දුරුකෙරෙයි ඒ ශීලගුණයෙන් යුක්තවූයේ, ආර්‍ය්‍යයන් නොදකිනු කැමැත්තය, ආර්‍ය්‍ය ධර්මයන් නොඅසනු කැමැත්තය, සිදුරුසොයන සිතය යනධර්මයන් දුරුකෙරෙයි, ඒ සිදුරුසොයන සිත්නැතිවූයේ මුළාසිහිය නුවනින්යෙදී නොපැවැත්මය නොයෙක් විසම අරමුණුකරා සිතයැවීමය යන ධර්මයන් දුරුකෙරෙයි, ඒ නොයෙක් අරමුණුකරා සිතයැවීමෙන් විනිර්මුක්තවූයේ නුනුවනින් මෙනෙහිකිරීමය, මිථ්‍යාදෘෂ්ටිආදීන් සෙවීමය යහපතට නොනැමී සිත සැඟවීමය යනධර්මයන් දුරුකෙරෙයි, ඒ නොසැඟළුනු සිත්ඇත්තේ සියකයකෙරේ කඳක් පාසා සතර සතර අයුරෙන් වරදවාසිතන, දෘෂ්ටියද බුද්ධාදි අට්නැන්හි කරණ සැකයද ශාසනයෙන්පිට අජවෘතාදියෙන් ශුද්ධියසලකා පවත්වනලද සීලබ්බත පරාමාසය යනධර්මයන් දුරුකෙරෙයි, ඒ නිස්සඬකිවූ ආර්‍ය්‍යපුද්ගලතෙම රාගය ද්වෙෂය මොහය යනධර්මයන් දුරුකෙරෙයි ඒ අමොහී පුද්ගලතෙම, රාගය ද්වෙෂය මොහය යන ධර්ම දුරුකොට කෙලශමුක්තනින්ගේ වාසස්ථානවූ නිර්වාණක්‍ෂෙමභූමියට පැමිනීමෙන් ජාති ජරා මරණයන් දුරුකොට සුඛප්‍රාප්ත වන්නේය යනුභාවයි.

චක්‍ෂුසූත්‍ර ව්‍යාඛ්‍යානය නිමි.

# ජාත්‍යාදි නිර්වචන.

හෙවත්

මේ සූත්‍රයේ ජාත්‍යාදිපදයන්ගේ තත්වාර්ථ ප්‍රකාශකිරීමයි.

විභඞ්ග ප්‍රකරණයේ සූත්‍රාන්තභාජනියෙහි—තත්‍ථ කතමා ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති ජාති.

තත්‍ථ, එහි; ජාතිකතමා, ජාතියනම් කවරීද? තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන්ගේ; තම්හි තම්හි සත්තනිකායෙ, ඒ ඒ සත්වසමූහයෙහි; යා ජාති, යම් ඉපදීමක්වේද; සඤ්ජාති, හට ගැම්මක් වේද; ඔක්කන්ති, උත්පත්තිස්ථානයට ඇතුළ්වීමක් වේද; අභිනිබ්බත්ති, විශෙෂයෙන් ඉපදීමක් වේද; ඛන්ධානං පාතුභාවො, ස්කන්ධයන්ගේ පහළවීමක් වේද; ආයතනානං

පටිලාභො, චක්ඛායතනාදි ෂඩායතනයන්ගේ ප්‍රතිලාභයක් වේද; අයං,මෝතෙමෝ; ජාතිවුච්චති, ජාතියයි කියනුලැබේ.

ජනනං ජාති, ස්කන්ධයන්ගේ පහළවීම ජාතිනම්=ඒ කෙසේදයත්=මව ඍතුනිවනු දවසට යටින් සත්දවසක් ගර්භය හටගන්නා ස්ථානයෙහි කරඹපලයක්සා රත්පොලෙක් නැගී සිල්ව ක්‍රම ක්‍රමයෙන් වැඩී මහ වැටකොලුපලයක්සාව ඍතුනීවන දවස සිල්ව තුන්හතරදවසක් වැනී ගැබපිහිටන ගුඩස්ථානයෙහි වැකුණු පහන් තලතෙල්බඳු ඍතුනිලෙයත්-තත්කාල සම්භූතවූ ශුක්‍රයත් යනදෙක ප්‍රත්‍යයකොට ගෙණ දඹදිව මිනිසුන්ගේ කෙශයක් අටභාගයක් කළකල ඉන් එකෙක් උතුරුකුරු දිවයින මිනිසුන්ගේ කෙශයක් ප්‍රමාණ වෙයි—එයටත් වඩා සියුම්වූ හුණපුපුළු රෙමයක් පහන් තල තෙල ගලා නහානත්කළ වැගිරගොස් ලොම්අග ඉතිරිවතුබු බිඳුප්‍රමාණවූ, දිවැසටමුත් මසැසට විෂය නොවන්නාවූ සියුම් වූ මඩ දිය බිඳුවක් වැනිවූ කලලරුවද, ඉන්පසු කර්මකෙලශාදි හෙතුසාමාග්‍රිය ලැබ මස්දෙවූ දිය බඳුවූ වටකුරු බිඳුවක් වැනිවූ අර්බුදාකාරයද ඉන්පසු දියේ හටගන්නා පෙනවැදැල්ලක් වැනිවූද, විලික්ෂවශිය මිරිස්පල ශූසෙක්හි පැහැයක් මෙන් මදක් රතුවූද, හෙවත් පැසුනු ලෙයක් බඳුවූ වැදලි අවස්ථාවක්ද ඉන්පසු මිදුනාවූ කිකිලිබිජු මදයක්මෙන් බොල්වූ ශරීරය අතිරකනවූ ඝනාකාරයද පහලවී ඒ ඝනයෙන් මාංසයෝ නික්ම වැඩී පිළිකා පහළවී හස්තපාදාදීන් සම්පූර්ණ වීමෙන් ස්කන්ධායතනයන්ගේ ප්‍රතිලාභය ජාති නම්.

**2** තත්‍ථ කතමා ජරා? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිතත්තචතා ආයුනොසංහානි ඉන්‍ද්‍රියානං පරිපාකො අයංවුච්චති ජරා.

තත්‍ථ, එහි; ජරාකතමා, ජරාව කවරක්ද; තම්හිතම්හි සත්තනිකායෙ, ඒ ඒ සත්ව සමූහයෙහි (උපන්නාවූ) තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන්ගේ; යාජරා, යම්ජරාවක් වන්නීද; ජීරණතා, (ජරාවෙන් සත්වයන්) දිරණබවද; ඛණ්ඩිච්චං (දත් ඇට) කැඩුනුබව හෙවත් ගැළුඋනබවද; පාලිච්චං, (කෙස් ලොම්) පැසී සුදුවූබවද; වලිත්තචතා, රැලිනැගුණු සම්ඇති බවද; ආයුනො සංහානි, ආයුසයාගේ හානිය හෙවත් ගෙවීමද; ඉන්‍ද්‍රියානං පරිපාකො, ඉන්‍ද්‍රියයන්ගේ මුහුකුරායාමෙක් ඇද්ද; අයංජරා වුච්චති, මේ ජරායයි කියනුලැබේ.

ජීරති ජීරනන්ති වා ජරා=දිරාතුයි හෝ දිරීම ජරානම්—ඒ කෙසේදයත්—යම් ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ උත්

පතනියේ පටන් අවුරුදු අසූවක් හෝ අනූවක් හෝ සියයක් හෝ ගතවීමෙන් සරීරය ගොනැස්සක්සේ වකුටුවීමය—කරි ආදින් බිඳී නැමීම හෙවත් කුදුවීමය වෙවුලීමය—දත් ගැලවී වැටීමය–කෙස් ලොම් පැසී සුදුවීමය—සම රැලිනැගීමය–කෙස්වැටීමෙන් හිස මුඩුවීමය යනාදී වශයෙන් ස්කන්ධයන්ගේ පරණවීම් ලිහිල්වීම් ස්වභාවට පැමිණේද—ඒ ජරා නම්.

3 තත්ථකතමං මරණං–යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කළෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො ඉදංවුච්චති මරණං.

තත්ථ, එහි; මරණං, මරණයතෙම; කතමං, කවරක් වන්නේද; තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්ත්වයන්ගේ; තම්හා තම්හා සත්තනිකායා, ඒ ඒ සත්ත්වනිකායෙන්; යාචුති, යම් චුතවීමක් වන්නීද; චවනතා, ජීවිතය ගැලවී යන බවද; භෙදො, බිඳීමක් වේද; අන්තරධානං, (රූපස්කන්ධාදීන්ගේ) අතුරුදන් වීමද; මච්චු මරණං, මරණින් මියයාමද හෙවත් මච්චුසංඛ්‍යාත මරණයද; කාලකිරියා, මරණ කාලක්‍රියාවද; ඛන්ධානංභෙදො, ස්කන්ධයන්ගේ බිඳීමද; කළෙබරස්ස නික්ඛෙපො, ශරීරයාහැර දැමීමක්වේද; ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො, ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමක්වේද; ඉදං, මේ; මරණං, මරණයයි; වුච්චති, කියනුලැබේ.

මරන්ත්‍යනෙනාති මරණං=මේකරණකොටගෙණ මියෙත් නුයි චුති ස්කන්ධයෝ මරණනම්=නොහොත්=මියනං මරණං (මෙහි ජීවිතෙන්ද්‍රිය) සිඳීම හෝ මැරීම මරණනම්–හේ ඛණික මරණ සම්මුතිමරණ සමුච්ඡෙදමරණ වශයෙන් තුන්ආකාරයි—පවත්ත රූපාරූප ධම්මානං, ප්‍රවෘත්ත රූපාරූප ධර්මයන්ගේ; භෙදො, භෙදය; ඛණිකමරණං; ඛණිකමරණනම්—තිස්සොමතො, තිස්සතෙම මලේය; ඵුස්සොමතො, ඵුස්සතෙම මලේයයි; ඉදං, මේ සම්මුතිමරණං, සම්මුතිමරණනම්–ඛීණාසවස්ස, රහත්හුගේ, අප්පටිසන්ධිකා, නොපිළිසිඳගන්නා බවවූ; කාලකිරියා, කාලක්‍රියාතොමෝ සමුච්ඡෙදමරණං, සමුච්ඡෙදමරණනම්—මෙහි සම්මුතිමරණයයි අභිප්‍රාය කරණලදී.

මේ ජාතිජරා මරණයෝ සත්ත්වවධක දොෂාපෙක්ෂකවූ පස මිතුරන් වැනියි—යම්සේ පුරුෂයක්හු මරණයට පමුනුවනු කැමතිවූ පසමිතුරන් තුන්දෙනෙක් අතුරෙහි එකෙක් මම අසවලා කැඳවාගෙණ අසවල් වනයට යන්නෙමි එකෙක් මම ඔහුට තලා දුර්වල කරන්නෙමි එකෙක් මම දුර්වලවූ ඔහු

ගේ හිස කපනෙනම්යි ගිවිසගෙණ පළමුපසමිතුරා ඔහු වනයට පමුනුවන්නේද දෙවෙනි පසමිතුරා ඔහුව තලා දුර්වල කරන්නේද තුන්වෙනි පසමිතුරා ඔහුගේ හිස කපා ජීවිතක්ෂයට පමුණුවන්නේද එසේම සත්වයා ස්වකීය කුශලාකුශල කර්මයෙන් යම්කිසිතැනක උත්පත්තියට පැමිණීමද ඒ සත්වයා ජරාවෙන් දුර්වල වීමද ඒ සත්වයා ඒ ජරාවට අනතුරුව ජීවිතක්ෂයට පැමිණීමද දතයුතුයි-මෙසේ මේ ජාතිජරාමරණ යන් නිසා සත්වයෝ අනන්ත අප්‍රමාණ දුක් විඳිත්යයි නුවනින් සලකා මෙයින් නිදහස්වීමට දානශීලාදී කුසල් කටයුතුයි.

1 රාගො—රඤ්ජනත්‍යනෙනාති රාගො—මේ කාරණකොටගෙණ ඇලෙත්නුයි රාගනම්-සයං රඤ්ජතීති වා රාගො-තෙමේ රඤ්ජනය කෙරේනුයි හෝ රාගනම්—යම් වස්තුවක් කෙරෙහි ඇලීම රාගනම්—මේ රාගය කුමක් විෂයකොට උපදීද යත්? රූපාදී අරමුණු විෂයකොට උපදියි—ඒ කෙසේ ප්‍රහාණ කටයුතුද අශුභාකාරය මෙනෙහිකිරීමෙන් ප්‍රහාණකටයුතුයි.

2 දොසො—දුස්සති එතෙනාති දොසො—මෙයින් දූෂ්‍යවේනුයි දොසනම්—සිත දූෂ්‍යවීමට පමුණුවන කෙලශය නොහොත් තරහවීම ද්වෙෂයයි—මේ ද්වෙෂය කුමකින් උපදීදයත්? ප්‍රතිඝ නිමිත්ත යෙනැයි දතයුතු—මේ කුමකින් ප්‍රහාණකටයුතුද? සියලු සත්වයන් කෙරෙහි එකාකාර ස්නෙහයවූ මෛත්‍රිය වැඩීමෙන් ප්‍රහාණ කටයුතුයි.

3 මොහො—මුය්හතීති මොහො—මුලා වේනුයි මොහනම්—ඇත්ත ප්‍රකෘත දැනගතනොහී අඳුරේ වැදුනාක් මෙන් මුලාවීම මොහයයි—මේ මොහය කුමකින් උපදීද යත්? අයොනිසොමනස්කාරයෙනැයි දතයුතු—ඒ කුමකින් ප්‍රහාණ කටයුතුද? අනිත්‍යාදී ත්‍රිවිධලක්ෂණ වශයෙන් සිහිකරණ නුවනයයිකියනලද යොනිසොමනස්කාරයෙන් ප්‍රහාණ කටයුතු.

මෙකී රාග ද්වෙෂ මොහ සංඛ්‍යාත රජසින් සිත කිළුටුවූ කල සමථවිදර්ශනා නැමති පිරිසිදු ජලයෙන් සොදා ඒ සිත පිරිසිදුකළ යුතු.

1 සක්කායදිට්ඨි—අත්තනො කායො සක්කායො—තමාගේ කය සක්කාය නම්—සක්කායෙ දිට්ඨි සක්කායදිට්ඨි—ස්වකීය කය කෙරෙහි වරදවා ගැනීම හෝ වරදවා සිතීම සක්කාය දිට්ඨි නම්-ගේ මෙසේ දතයුතු-මට මේ ආත්මය ඇතැයි ශාස්වතවශයෙන්ද මාගේ ආත්මය උත්පත්තිවශයෙන් නැතැයි උච්ඡේදවශයෙන්ද විඤ්ඤාණස්කන්ධය එකආත්මයක් වශයෙන්ද රූප වෙදනා සඤ්ඤා සංස්කාර යන ස්කන්ධසතර එක ආත්ම

යක් වශයෙන්ද විඤ්ඤාණස්කන්ධය ආත්මයය අවශේෂ ස්කන්ධ සතර අනාත්ම වශයෙන්ද රූප වේදනා සඤ්ඤා සංඛාර යන ස්කන්ධ සතර ආත්මයය අවශේෂවූ විඤ්ඤාණස්කන්ධය අනාත්මය යනාදිවශයෙන්ද සැලකීම නොහොත් මෙසේ සියකය කෙරෙහි වරදවා සිතීම සත්කායදෘෂ්ටි නම්වේ.

**2** විචිකිච්ඡා—සභාවං විචිණනො තාය කිච්ඡති කිලමති විචිකිච්ඡා—කිච්ඡති යයි සේයි සවභාව සිනමින් එයින් කලාන්තවේනුයි විචිකිච්ඡා නම්—ඒ මෙසේ දතයුතු—බුදුන්ය ධර්මය සංඝයාය ශික්ෂාවය පුබ්බන්තය අපරන්තය පුබ්බන්තාපරන්තය ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය යන අට තැන්හි උපදනා සංසයලක්ෂණවූ සැකය විචිකිච්ඡා නම්.

**3** සීලබ්බතපරාමාසො—සීලං ච වතං ච සීලවතානි—සීලය හා ව්‍රතය සීලබ්බත නම්—සීලබ්බතානං පරාමාසො සීලබ්බත පරාමාසො—සීලව්‍රතයන්ගේ පරාමර්ශනය සීලබ්බතපරාමාස නම්—හේ මෙසේ දතයුතු—මේ බුද්ධශාසනයෙන් පිටත් ශ්‍රමණබ්‍රාහ්මණාදීන්ගේ සීලාදියෙන් හා ව්‍රතසමාදානාදියකින් ශුද්ධියක් ඇතැයි සිතා ඒ ඒ අයගේ සවභාව පිරිසිදුයයි දෘඪ කොට සිතාගැම්ම සීලබ්බතපරාමාස නම්.

**1** අයොනිසොමනසිකාරො—අයොනිසොමනස්කාරයනම් අනුපාය මනසිකාරෙ, අනුපායෙන් මෙනෙහි කිරීමය; උප්පථ මනසිකාරෙ, නොමග මෙනෙහි කිරීමය; හේ කෙසේදයත් අනිත්‍ය ධර්ම නිත්‍යයයි කියාද දුක කෙරෙහි සැපයයිද අනාත්මය කෙරෙහි ආත්මයයිද අශුභය කෙරෙහි ශුභයයිද මේ ආදිවශයෙන් වරදවා සිතීම අයොනිසොමනස්කාරයි.

**2** කුම්මග්ග සෙවනා—කුච්ඡිතො මග්ගො කුම්මග්ගො (භයානකාරය සහිතවූ නපුරු නරක) මාර්ගය කුම්මග්ග නම්—ඒ කුමාර්ගය කවරේද? මිථ්‍යාදෘෂ්ටිය මිථ්‍යාසංකල්පය මිථ්‍යා වචනය මිථ්‍යා කර්මාන්තය මිථ්‍යා ආජීවය මිථ්‍යා ව්‍යායාමය මිථ්‍යා සමෘතිය මිථ්‍යා සමාධිය යන මේ කුමාර්ගයයි කියනු ලැබේ—කුම්මග්ගස්ස සෙවනා කුම්මග්ගසෙවනා—මෙකී මිථ්‍යා දෘෂ්ටි ආදීන්ගේ සෙවනය කුම්මග්ගසෙවනය නම්වේ—නිවන් මගවසා නරකමග යාමහෝ සෙවනය කිරීමය යන අදහසයි.

**3** චෙතසොලීනත්තං-චිත්තයාගේලීනත්වයනම් සිතහැකිළීමයි නොහොත් කාමච්ඡන්දාදීන් චිත්තයාගේනොසන්සිඳීමයි.

**1** මුට්ඨස්සච්චං—මුට්ඨස්සතිස්ස භාවො මුට්ඨස්සච්චං—මූළාසිහියගේ සවභාව මුට්ඨස්සච්ච නම්—රූපාරූප ධර්මයෙහි මූඪභාව

යෙන් කම්පලක්ෂණවූ සිහියයි—තවද හිතාහිතවූද සාවද්‍ය නවද්‍යවූද කුශලාකුශලවූද සුචරිත දුශ්චරිතාදිවූද ධර්‍මයන් කෙරෙහි මූලාවූ සිහිය මුට්ඨස්සච්චයයි දතයුතු.

2 අසම්පජඤ්ඤං—අසම්පජානස්ස භාවො අසම්පජඤ්ඤං—අඥාන ස්වභාව අසම්පජඤ්ඤ නම්—ස්ථාන ගමන නිෂද්‍යාදි සියලු ක්‍රියාවන්හි නුවණින් යුක්තනොවන ස්වභාවයි.

3 චෙතසො වික්ඛෙපො—චිත්තවික්ෂේප නම්—සිත නො සන්සිඳීම හෝ විසිර පැවැත්මයි—ඖද්ධත්‍යයහා එක්ව නො සන්සුන් ස්වභාවයෙන්විසිර පවත්නා සිතයයි දතයුතු.

1 අරියානමදස්සනකම්‍යතා—ආර්‍ය්‍යයෝ නම් බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ බුද්ධශ්‍රාවකයෝය—මෙකී ආර්‍ය්‍යයන් නොදක්නු කැමැත්ත හෝ සමීපයට නොඑළඹෙනු කැමැත්ත ආර්‍ය්‍යාදර්ශනකම්‍යතායයි දතයුතු.

2 අරිය ධම්මස්ස අසොතුකම්‍යතා—ආර්‍ය්‍ය ධර්‍මනම් සතරසතිපට්ඨානාදිවූ සත්තිස්බොධිපාක්ෂිකධර්‍මයෝය-මේ සත්තිස්බොධිපාක්ෂික ධර්‍මයන් ඇසීමට ඉගෙණීමට දැරීමට යම් නොකැමැතිබවක් වේද ඒ ආර්‍ය්‍යධර්‍ම අසොතුකම්‍යතායයි කියනුලැබේ.

3 උපාරම්භචිත්තතා—උපාරම්භතීති උපාරම්භො—අවද්‍යාරොපනය කෙරේනුයි උපාරම්භ නම්-උපාරම්භං චෙතෙතීති උපාරම්භචිත්තං—වරද ආරොපනය කොට සිතානුයි උපාරම්භචිත්තනම්—උපාරම්භචිත්තස්ස භාවො උපාරම්භචිත්තතා—උපාරම්භචිත්තයාගේ ස්වභාව උපාරම්භචිත්තතා නම්-අනුන්ගේ වරද සොයන සිතය යන අදහසයි—ඒ මෙසේ දතයුතු—යම්සේ සන්නාලියෙක් හෙවත් රෙදි වියන්නෙක් වස්ත්‍රයක් දිගහැර සිදුරුම බලාද එපරිද්දෙන් මෙරමාගේ සිදුරු සොයන සිතයි.

1 උද්ධච්චං—උද්ධතස්ස භාවො උද්ධච්චං—උද්ධතවූවහුගේ ස්වභාව උද්ධච්ච නම්—සිත භ්‍රාන්තබව චිත්තවික්ෂේපය සිත නොසන්සුන් බවය යන අදහසයි.

2 අසංවරො—සංවරයති පිදහතීති සංවරො-සංවරයතීයයි සේයි—පිදහතීති—වැසීමකෙරේනුයි සංවර නම්—නාසංවරො අසංවරො-සංවර නොවන්නේ අසංවර නම්-ඇස් කන් නාසා දිව කය සිත යන සඬෙන්ද්‍රියයන් අගොපනය ආරක්‍ෂා නො කිරීම අසංවරයයි කියනු ලැබේ

3 දුස්සීල්‍යං—දුස්සීලස්ස භාවො දුස්සීල්‍යං—දුසිල්බව දුස්සීල්‍යනම්—කායිකවූද වාචසිකවූද කායික වාචසිකවූද අජ්ඣාචාරය දුස්සීල්‍යයයි කියනුලැබේ.

1 අස්සද්ධියං—නත්ථිසද්ධා එතස්සාති අස්සද්ධො—මොහට ශ්‍රද්ධාව නැත්තූයි අස්සද්ධ නම්—අස්සද්ධස්ස භාවො අස්සද්ධියං—නොඅදහන්නාහුගේ ස්වභාව අස්සද්ධිය නම්—බුදුන් දහම් සඞ්ඝයා නොඅදහන බවයි.

2 අවදඤ්ඤුතා—නවදඤ්ඤු අවදඤ්ඤූ—දනසීලී නොවත්නේ අවදඤ්ඤූ නම්—අවදඤ්ඤුස්ස භාවො අවදඤ්ඤුතා—දනසීලී නොවන්නාහුගේ ස්වභාව අවදඤ්ඤුතා නම්—සිත ආවාසමාත්සර්යාදීන් යුක්තයයි නොදන්නාබව හො තද මසුරු වශයෙන් දෙවකරව යන වචනයාගේ ගුණ නොදැනීමයි.

3 කොසජ්ජං—කුසීතස්සභාවො කොසජ්ජං—මැලිහුගේ ස්වභාව කොසජ්ජ නම්—කායදුශ්චරිතාදීන් විෂයෙහිද පඤ්චකාමයන් විෂයෙහිද සිත බැස පැවැත්මයි—කුසලධර්මයන් නොවඩන අසෙවන ස්වභාවයි.

1 අනාදරියං—න ආදරෙ අනාදරෙ—ආදර නොවත්නේ අනාදර නම්—අනාදරස්ස භාවො අනාරියං—අචිත්තීකරණයාගේ ස්වභාව නාදරිය නම්—අගරු බවය-අචිත්තීකරණය අසීල්‍යය යන අදහසයි.

2 දෝවචස්සතා-හැහැදූම්යන් විසින් අවවාද කියනු ලබන කල්හි ඒ පිළිකුල්කොට සිතා නොපිළිගන්නා ස්වභාවය යන අදහසයි.

3 පාපමිත්තතා-පාපෙනමිත්තතා-පාපමිත්තතා-පාපයන්හා මිතුරුවන්නේ පාපමිත්‍ර නම්-පාපමිත්තස්සභාවො පාපමිත්තතා-පවිටු මිතුරුහුගේ ස්වභාව පාපමිත්තතානම්-ලෙව්හි ශ්‍රද්ධා නැත්තාවූ දුස්සීලවූ අල්පශ්‍රැතවූ මසුරුවූ ප්‍රඥනැත්තාවූයම් පුද්ගලයෝ වෙත්ද-ඔවුන්හා යම් සෙවනයක් භජනයක් සම්ප්‍රවඞ්ක ස්වභාවක් වන්නීද ඒ පාපමිත්‍ර ස්වභාවයි කියනු ලැබේ.


1 අහිරිකං—න හිරීයතීති අහිරිකං—(ලජ්ජාවියයුත්තෙති) ලජ්ජානොවේතූයි අහිරික නම්—ලාමකවූ අකුසලධර්ම සම්ප්‍රාප්තියෙහි ලජ්ජා නොවීමය යන අදහසයි.

2 අනොත්තප්පං—න ඔත්තපතීති අනොත්තප්පං (භීයචිය යුත්තෙති) බිය නොවේතූයි අනොත්තප්ප නම්—ලාමකවූ අකුසලකම් සම්ප්‍රාප්තියෙහි බියනොවීමය යන අදහසයි.

3 පමාදො—පමජ්ජතීති පමාදො-ප්‍රමාදවේතූයි පමාදනම්—පමජ්ජනභාවොවා පමාදො-පමාවනබවහෝ පමාද නම්-සුචරිත ධම්විෂයෙහි ස්මෘතිවිප්‍රවාසයහෝ නොඑලඹසිටී සිහියයි.

නිමි

# සබ්බ දානං ධම්ම දානං ජීනාති



නිබ්බාන පච්චයෝ හෝතු